HNB GRAMEEN මෙහෙවර

අඳුර දුරලන සොඳුරු මෙහෙවර

2017 ජනවාරි - පෙබරවාරි කලාපය

පරාජයන් ඉවසමින් ලද ජයග්‍රහනයන්ද
දුක් කම්කටොලු දරමින් ලද හසරැල්ද
වැරදීම් තුළින් ලද අත්දැකීම්ද
පුරා වසර 17 ක අප ගමන් මග
ඒකාලෝක කළේය.
මූල්‍ය කෙෂ්ත්‍රයේ ප්‍රමුඛයෙකු වීමට
අප ලද පන්නරයද එයමය.
ලද අත්දැකීම් සහ ජයග්‍රහණයන්
තුළින්...

අපි නව වසරකට පා තබමු.

ඔබ සැමට

2017 සුභ නව වසරක් වේවා!

සිතනවාට වඩා සොඳුරු ලෝකෙක අප ජීවත්වෙන්නේ...

2016 ගෙවී ගිහින් 2017 ලබනවා. පැය..දවස්.. සති..මාස..අතරින් කාලය ගෙවිලායනවා..ගෙවියන කාලයත් එක්ක ලෝකය වගේම මිනිස්සුත් වෙනස් වෙනවා. ඒ "වෙනස" තුළින් තමන්ගේ ජීවිතය ජයග්‍රහනය කරා රැගෙන ගිය මිනිසුන් කිහිපදෙනකු පිළිබඳවවූ මේ කතාව නව වසරක එළිපත්තේ සිටින ඔබට පූර්වාදර්ශයක් සපයාවි. ඔබේ ජීවිතයේත් සැබෑ වෙනසකට මග පාදා ගැනීමට.

JAN KOUM

Jan Koum කියන්නේ වට්ස්අප් නමැති සමාජ ජාල අඩවියේ නිර්මාතෘවරයා. 39 හැවිරිදි ඔහු අවුරුදු 16 දී ඇමරිකාවට සංක්‍රමණය උනේ යුක්‍රේනයෙන්. ඔවුන් ඒ කාලයේ ජීවත් වුනේ ඇමරිකානු රජයේ දීළිදු අය වෙනුවෙන් ලබාදුන්න ආහාර සලාක කූපන් මගින්. මේ කූපන් වලට ආහාර ලබා ගැනීමට Jan පැමිණි ස්ථානයට යාබදව තිබුන Mount View හී තමන්ගේ වට්ස්අප් කාර්යාල සංකීර්ණය මතු දවසක ඉදිකරන්න ලැබේවි කියලා මේ දුප්පතා කෙසේ නම් සිතන්නද.

වර්තමානය වන විට ලෝකය පුරා මිලියන 600 ජනතාවක් විසින් භාවිතා කරන, පණිවිඩයක් යැවූ සැනින් එය ලබන්නා වෙත ලඟා වන එතෙක් පැවති සාමාන්‍ය SMS ක්‍රියාවලියට වඩා දියුණු ක්‍රමයක ප්‍රවිශ්ඨය ලබන්න Jan Koumට හැකිවුණා. මේ ජාලය 2014 වසරේ මුලදී ෆේස්බුක් සමාජ ජාලය විසින් ඩොලර් බිලියන19 ක මුදලකට මිලදී ගත්තා. ගනුදෙනුව නිමවුණේ ඇමරිකාවේදි දුප්පතෙකු ලෙස ජීවිතය ආරම්භ කළ Jan Koum බිලියනපතියන්ගේ ලැයිස්තුවට එකතු කරමිනි.

JAK MA

තමන්ගේ ළමා කාලය දරිද්‍රතාවයේ දුක්ඛ දෝමනස්සයන් එක්ක ගත කළ Jak Ma අද ඩොලර් බිලියන 20.2 ක් සහිත ධනවතෙක්. චිනයේ Hangzhou ප්‍රාන්තයේ ඉපදුන ඔහුට රැකියාවක නිරතවෙන වයස එළඹුනාම අඩුම තරමේ KFC අවන්හලක හෝ රැකියාවක් ලබා ගන්න නොහැකි වුණා. ජාතික විද්‍යාලයට අතුලුවීමේ විභාගයෙන් දෙවරක් අසමත් වුනත් අවසානයේ ඔහුගේ අප්‍රතිහත ධෛර්යය නිසාම උපාධිදාරියෙකු වී ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස කටයුතු කරන්නට පසුව හැකියාව ලැබුනා.

ඔහු හාපුරා කියලා ඇමරිකාවට එන්නේ 1995 දී. එදා තමයි Jack Ma පළවෙනි වතාවට අන්තර්ජාලය දකින්නේ. චීන නිෂ්පාදනවලට අන්තර් ජාලයේ ඉඩක්වෙන් කර ගන්නට හැකියාවක් ඇතිවේවි කියන විශ්වාසයෙන් ඔහු බැරි බැරි ගාතේ චීන අකුරුවලින් වෙබ්පිටු කීපයක් ආරම්භ කළා. අන්තර්ජාලය තුළ චීන භාෂාවෙන් ආරම්භ කළ පළමු වෙබ්පිටු ලෙස මේවා වර්තමානය වන විට විවාදයට ලක් වී තිබෙනවා. නමුත් මේ වෙබ්පිටු මේ කියනකාලයේ දි චීන අකුරු පිළිබඳ ගැටලුවක් නිසා වෙබ් අඩවිය සමඟ විවෘත වී නැහැ.

1999 වසරෙදි ඇරඹුන Alibaba නමැති අන්තර්ජාල භාණ්ඩ අළෙවි වෙබ් අඩවිය මේ වෙද්දි සුප්‍රසිද්ධ Amazon නමැති අන්තර්ජාල අළෙවිකරුවාමෙන් දෙගුණයක් ගනුදෙනුකරුවන් හසුරවනවා. චීනයේ ධනවත්ම මිනිසා ලෙසත් Jack Ma මේ වෙද්දි සම්මානයට පාත්‍ර වී අවසන්.

INGVAR KAMPRAD

අවුරුදු 7 ක විතර පුංචි කොලු පැටියා කාලෙ Ingvar Kamprad ජීවත්වුනේ ස්වීඩනයේ පිටිසර පළාතක. ඔහු ඒ කාලෙ තමන්ගෙ අසල්වැසියන්ට ගිණිකූරු අළෙවි කළා. අවුරුදු 7 දී (1920)අහළ පහළ අයට ගිණිකූරු අළෙවි කරපු මේ පුංචි කොල්ලා එයින් පස්සේ ගිණිකූරු වෙනුවට පැන්සල්, සුභ පැතුම් පත්. නත්තල් සිහිවටන, වගේ දේවල් අළෙවි කළා. කෙහොම හරි වයස අවුරුදු 17 වෙද්දි මේ ධෛර්යවන්ත ගැටයා තමන්ගෙම කියලා සමාගමක් ආරම්භ කළා. ඒකෙ නම IKEA (Ingvar Kamprad from Elmtaryd Agunnaryd) ඔහුගේ නම සහ තමා ජීවත්වුන නගරයේ නම තමයි මේ අකුරු හතරෙන් ලඝු කරලා තියෙන්නේ. වයස අවුරුදු 21 දී Kamprad තමාගේ සමාගම තුළින් ගෘහ භාණ්ඩ අළෙවියට අත තිබ්බා. එතැනින් තමයි. IKEA නමැති අධිරාජ්‍යයේ ආරම්භය සනිටුහන් වුනේ.

වර්තමානය වෙද්දී මේ සමාගම ව්‍යාපාරික ලෝකයේ දැවැන්තයෙක් බවට පත්වෙලා. රටවල් 42 ක අළෙවිසැල් 350කට ආසන්න ප්‍රමාණයක් බිහිවෙලා. වාර්ෂික පිරිවැටුම ඩොලර් බිලියන 36 ක්. කොතරම් ධනයක් තමාසතුව තිබුණත් මේ මහා මිනිසා ඉතාම චාම් අන්දමින් ජීවත්වන්නේ. කොතරම් චාම් ද කියලා කියනවා නම් අවුරුදු 88ක් වයස ඔහු තවමත් ගුවන් ගමන් යන්නේ පිරිමැසුම් පන්තියෙ (Economy Class).

HOWARD SCHULTZ



Howard Schultz. ඔහු Starbucks කෝපි සමාගමේ හිමිකරුය. බ්‍රිතාන්‍ය ටැබ්ලොයිඩ් පුවත් පතකට Howard වරක් කිව්වේ මෙවැනි දෙයක්.

මම ජීවත් වුනේ තට්ටු නිවාස සංකීර්ණයක දුප්පත් පවුලක. කෙමෙන් කෙමෙන් වයසින් මුහුකුරා යද්දි මට හිතුනෙම මම සාර්ථකත්වයේ පාරෙ නෙමෙයි යන්නෙ කියලයි. මම දැන හිටියා කොහොමහරි සාර්ථකත්වය නමැති මාර්ගයට පිවිසුනා නම් ගොඩක් දේපළ, සල්ලි, සතුටෙන් ඉන්න පවුලක්, ලබා ගන්න හැකි බව. ඉතිං මම කොහොමහරි උත්සාහ කළා මගේ මාර්ගයෙන් පිටවෙලා අනිත් මාර්ගයට පිවිසෙන්න. මම අද හොඳ සූට් එකක් ඇදලා ටයි එකක් දාගෙන ඉන්නවා තමයි, නමුත් මට තවමත් මගේ මුල් කාලය මතකයි.

Schultz තමන්ගේ උපාධිය ලබා ගත්තට පස්සෙ Xerox නැමැති ආයතනයේ සේවයට එකතු වුණා. ටික කාලෙකට පස්සේ ඔහු ඒ අහල පහල තිබුන Starbucks නමැති කෝපි අළෙවි සැලක් මිලට ගත්තා. ඒ කාලය වන විට මේ අළෙවිසාලයටම තිබුණෙ අළෙවි සැල් 60 ක් පමණයි. 1987 දී තමන්ගෙ උත්සාහයෙන් Schultz මේ අළෙවි සැල් සියල්ලේම ප්‍රධාන විධායක බවට පත් වෙනවා. එයින් පසුවයි ඔහු තමන්ගේ ගමන සාර්ථක කර ගත්තේ. අද වෙද්දි ලෝකය පුරාම අළෙවි සැල් 16000කට වැඩියෙන් starbucks කෝපි අළෙවි කරනවා. 2014 වසර වනවිට ඔහුගේ වත්කම්වල වටිනාකම ඩොලර් බිලියන 2.1 ක්.

LEONARDO DET VECCHIO



Leonardo Det Vecchio මීට දෙවසරකට පෙර ඩොලර් බිලියන 18.4 ක හිමිකමක් තියෙන ධනවතෙක් වුණාට ඔහුගේ අතීතය බොහොම කටුක එකක්. ඔහුගේ ළමා කාලය ගෙවුනේ අනාථ නිවාසයක. තාත්තා කුඩා කාලයේම මිය ගිය නිසා දරුවෝ පස් දෙනෙකු පෝෂණය කරන්න වත්කමක් තිබුනේ නැති අම්මා තමන්ගේ දරුවන්ව අනාථ නිවාසයකට යවනවා. කරදඬු උස් මහත් වුණාට පස්සේ Leonardo කර්මාන්ත ශාලාවක සේවයට එකතු වෙනවා. එහිදි යන්ත්‍රයකට හසු වීමෙන් ඔහුට ඔහුගේ ඇඟිල්ලකින් කොටසක් නැතිවෙනවා. යකඩ අච්චු, වාහන අමතර කොටස්, ඇස් කණ්නාඩි රාමු වගේ දේවල් තමයි මෙහි නිපදවනු ලැබුවේ. වයස 21 දී තමන්ගේම කියලා සමාගමක් සුළුවෙන් ආරම්භ කරන්න Leonardo ට හැකිවුණා. අන්න ඒ සමාගම තමයි වර්තමානය වෙද්දී ලෝකයේ විශාලතම අව් කණ්නාඩි නිෂ්පාදකයා සහ වෙනත් ඇස්ආශ්‍රිත පළදනාවන් නිපදවන්නන් වෙන්නේ. Ray-ban සහ Oakley කියන්නේ ඔවුන්ගේ සන්නාම නාමයයි.

මේ කතා කීපය ජාලයෙන් පෙරලා මෙහි ගෙන ආවේ මේවා කියවන ඔබටත් ඔබේ බාධක කම්කටොලු පසෙකලා සාර්ථකත්වය කරා යාහැකි බවට ඉඟි කරන්නයි. ඔබ උපතින් කෙතරම් දුගී පවුලක ඉපදුණත් අනාතයෙක් විදිහට කුඩාකාලය ගත කලත් තමන්ගේ උත්සාහයත් අධිෂ්ඨානයත් මතින් ජීවිතය ජය ගන්නට මේ කෙටි විස්තර කීපය ඔබට කියාවි. ඉතින් ඔබේ සාර්ථකත්වය දෙවයටම භාර නොදි උත්සාහවන්ත වුවහොත් දෙවයේ ලියවුණ දේ ඔබටම වෙනස් කරන්නට හැකිවේවි.

-අන්තර්ජාලය ඇසුරිනි

HNB GRAMEEN
මෙහෙවර 03
2017 ජනවාරි - පෙබරවාරි

රටට බත සඳහා ගොවි පරපුරේ අභිමානය ගොවි දිරිය

ගොවිතැන ජීවිකාව කරගත් රටට බත සපයන ගොවි පරපුර වෙනුවෙන් HNB ග්‍රාමීන් සමාගම අභිනවයෙන් හඳුන්වාදෙන මූල්‍ය සේවාව ගොවි දිරියයි. බත ප්‍රධාන ආහාරය කරගත් ජනතාවක් වෙසෙන රටක් වුවද ගොවිතැනින් ජීවනෝපාය සරිකරගන්නා ගොවි මහතුන් මුහුණ දෙන ගැටළු බොහෝ වෙති. ඉන් ප්‍රධානතම ගැටළුවක් වන්නේ ගොවිතැන් කටයුතු සඳහා අවැසි වන මූලික ධනය සොයා ගැනීමේ ගැටළුවයි. මෙම ගැටළුව පිළිබඳව HNB ග්‍රාමීන්හි අවධානය යොමු කරවීමේ මූලික කෘතවේදීත්වය හිමිවිය යුත්තේ ග්‍රහර් ග්‍රාමීන් අම්පාර ශාඛාව යටතේ ක්‍රියාත්මක වන දෙහි අත්තකන්ඩිය සේවා මධ්‍යස්ථානයටය.

ගොවිදිරිය ණය ක්‍රමය පිළිබඳ මූලික යෝජනාව දෙහි අත්තකන්ඩිය ශාඛාවෙන් කළාම අපේ ඉහළ කළමනාකාරිත්වයත් තේරුම් ගත්තා ඇත්තටම වී ගොවිතැනෙන් ජීවත්වෙන ජනතාව වෙනුවෙන් ඔවුන්ගේ වෘත්තීය පසුබමට සරිලන ණය ක්‍රමයක අවශ්‍යතාවය ගැන.ඒ පිළිගැනීම යථාර්තයක්

බවට පත්වෙන්නේ පසුගිය දෙසැම්බර් නවවෙනිදා ගොවි දිරිය නමින් එම නව ණය ක්‍රමය එළි දැක්වීමත් එක්කයි.

ගොවි දිරිය ණය ක්‍රමය පිළිබඳව මෙහෙවරට අදහස් දැක්වූ HNB ග්‍රාමීන් හි **සහකාර සාමාන්‍යාධිකාරී පැතුම් සම්පත් කුරේ මහතාට** අනුව මෙම ණය ක්‍රමය වී ගොවීන් සඳහාම සුවිශේෂයෙන් හඳුන්වාදෙන්නකි. වී ගොවිතැන බහුල ලෙස ප්‍රචලිතව පවත්නා ප්‍රදේශයන් 16 ක් ඉලක්ක කර ගනිමින් මූලික වටයේදී ශාඛා 16 ක එනම් අම්පාර, අනුරාධපුර, මහියංගනය, පොළොන්නරුව, මැදවච්චිය, වවුනියාව, පදවිය, කන්තලේ, මඩකලපුව, ඇඹිලිපිටිය, මොනරාගල, නිකවැරටිය, බෙලිඅත්ත, කුරුණෑගල, ගල්ගමුව, හම්බන්තොට යන ශාඛාවන් හි ගොවි දිරිය ණය ක්‍රමය ක්‍රියාත්මක වෙයි.

HNB ග්‍රාමීන් හි සහකාර සාමාන්‍යාධිකාරී පැතුම් සම්පත් කුරේ මහතා සමඟ කළ සම්මුඛ සාකච්ඡාවකි



මීට අමතරව අනෙකුත් ශාඛාවන්හි මේ සඳහා ඇති අවශ්‍යතාව හා ඉල්ලුම පදනම් කර ගනිමින් ගොවි දිරිය ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.කන්න වශයෙන් යල සහ මහ කන්න ඉලක්ක කරගෙන 20000 ත් 50000 ත් අතර ණය මුදලක් ලබා ගැනීමට ණය ඉල්ලුම්කරුට හැකියි. මාස හයක කාල පරාසයක් තුළ ගෙවා නිම කිරීමේ පදනම මත ලබාදෙන ණය මුදල ගොවියාට වඩාත් පහසුවෙන් ගෙවන්නට හැකිවන සේ මුළු ණය මුදලින් 30% මුල් මාස පහ තුළ ගෙවන්නටත් ඉතිරි 70% අස්වනු නෙලන කාලයේදී එනම් හයවන මාසයේදී ගෙවා නිම කිරීමට හැකිවන පරිද්දෙන් ඉතා පහසු ක්‍රමවේදයක් මෙහිදී අප අනුගමනය කරනවා.ණය මුදල ලබා ගැනීම සඳහා ඇප කරුවන් දෙදෙනකු අවශ්‍යයයි.එසේම අවුරුදු 20 ත් 60 අතර වයසේ සිටින ගොවි මහතුන්ට ගොවි දිරිය ණය මුදල ඉල්ලුම් කළ හැකියි.

මංජුල ප්‍රභාත්

සුබ මංගලම්

එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් හි හම්බන්තොට ශාඛාවේ සුළු හා මධ්‍ය පරිමාණ ණය අංශයේ ණය නිළධාරියකු ලෙස සේවයේ නියුතු දිලිප් චන්දන මහතා උර්මි සඝිකලා මනුරත්න මෙනෙවිය සමඟ නව යුගදිවි ගමන් ඇරඹුවේ පසුගිය දෙසැම්බර් 02 වෙනිදාය.



එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු ශාඛා ජාල අංශයේ කළමනාකාරවරයකු වූ සනත් බණ්ඩාර මහතා නිලිකා සජීවනී මෙනෙවිය සමඟ නව යුගදිවි ගමන් ඇරඹුවේ පසුගිය නොවැම්බර් 10 වෙනි දින පෙ.ව.9.06 ට යෙදුණු සුබ මොහොතිනි.

එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයේ සහකාර ගණකාධිකාරවරයකු ලෙස සේවයේ නියුතු කනිල් පෙරේරා මහතා සචිනි විජේසිංහ මෙනෙවිය සමඟ නව යුගදිවි ගමන් ඇරඹුවේ පසුගිය ඔක්තෝබර් 21 වෙනිදාය.

සුන්දර යුගදිවියකට එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්හි කළමනාකාර අධ්‍යක්ෂ තුමන් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සහෝදර නිළධාරී මඩුල්ලේ සුභාශිංසණ ඔබ සැමට අපි මෙසේ පිළිගන්වමු.

යන්නට ස්ථානයක් නොමැති කෙනෙකුට මඟ කියාදිය නොහැකිය.

පහන් තාරුව

දියුණුව යමු ග්‍රාමීන් සමගින්

එච්.එන්.බී ග්‍රාමීන් නිළදරු සැමගෙන් ගම් අවසර
සොහොයුරියනි ඔබගේ අවසරය මෙමට මදක් දෙන්න

මීට වසර කීපයකට පෙර මැදවච්චියට ගොසින්
ණය ගන්නා විට මේ සර්ලා හිටියා මතකයි දැන්

වාහන හයරයට අරන් අපි මැදවච්චියට ගියා
දැන් බැංකුව ගලෙන් බිඳුණු වැවට ඇවිත් අපව සොයා

අද දින නම් හරිම හොඳයි දුන්නා අපහට දැනුමක්
එච්.එන්.බී යන මාවත වෙනස් වගේ හැගේ මදක්

මෙතෙක් කලක් මෙවන් පුහුණු ලබා තිබේ සිය ගණනක්
අද දැනුමින් මා ලැබුවේ ජීවිතයේ ලොකු වෙනසක්

දැනුම ලබා දුන් මැතිදුනි තුති දෙමි පලුගොල්ලගමින්
කථිකත්වය දියුණුව වැජඹේවා සම්බුදු සරණින්

ඉංදික සර්,මාධව සර්,රුවන් සර් ආවා ගමට
සජිත් සර් දැන් එනවා හැමෝම හර් හොඳයි අපට

බැංකුවෙ වැඩ කරන මිස්ද මුදල් අපට දෙන සර්ද
ආදරයෙන් සිහිකරනෙමි නුවන් සර්වද තුතිපුද

අතමිට හිඟ වෙලාවේ ලොකු ලොකු මුදලාලිලා ළඟට
යන්න ඕන නෑ අපහට දැන් ඒ ලොකු කම් බලන්න

කණ්ඩායම් වෙලා මෙලෙස ණය ගමු ගෙවනට හැකි ලෙස
දියුණුව යමු ග්‍රාමීන් සමගින් නංවා සිත තුති ගොස

- (ගලෙන් බිඳුණුවැව සේවා මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහනක් අවසානයේදී සාමාජිකාවක විසින් ගායනා කළ විරිදු පැදි පෙළකි.)

ආර්. එම්. කුසුමා අධිකාරී
මධ්‍යස්ථාන නායිකා - පලුගොල්ලාගම

HAPPY NEW YEAR 2017

සුබ නව වසරක්

සියල් සිරියෙන් සැරද සැමකල් ආයුවිද බෝකල් දිනේවා
පහන් සිතුවිලි වලින් නිබඳව සියළු දන හදවත් පිපේවා
නැණ නුවණ ලැබ ගුණ දමින් පිරිපුන්ව දිවි මඟ ඔපකෙරේවා
උදාවුණ නව වසර සැමටම සුබම සුබ නව වසක් වේවා

ඒ.ඒ.චාලට් විජයසිරි සාමාජිකා, හොරණ ශාඛාව

ඇස නැවතුණු තැන

බොරළු ඇණෙන පා රිදවන පාර දිගේ
අපෙ පා පැදිය යන තාලය නුහුරු වගේ
තනිකම ළඟට රැකවරණය සොයන මගේ
ගෙන යමි නුඹව රැකගෙන මම පුංචි නගේ

මකරු ලෙසින් පිඹ දුවනා රිය සක්කන්
පාර දිගට දත් විලිසන බලු කුක්කන්
රෑන පිටින් ඇස් දිලිසන නළු කොල්ලන්
මේ සැම අතරෙ නුඹට දෙවි පිහිටය සතර වරන්

තිළිණ දිසානායක

දූ ආදිත්‍යා....

මිණි කැට දසන් සලා
පෙර මඟ නෙතු සලු සලා
නොනිමෙන පෙම අත දරා
නෙතු දල්වයි මඟ බලා

පිය උරුමය මට ගෙනා
සුරලොව මනුලොව ගෙනා
වෙහෙස නිවන මන්තරේ
දූ ආදිත්‍යා....

ජය බිම ජයකෙළි නංවලා
ඉසුරු පුරය රැගෙන ආ
මගේ පුංචි යන්තරේ
දූ ආදිත්‍යා....

කේ. එල්. වරාජ් ප්‍රාදේශීය කළමනාකරු

පියාණෙනි....

හිරුට සැඟවී එබෙන්නාවූ
සඳයි ඔබ රැය පහන් කළ
දවාලේ ඇති ගිනියමට ඔබ
දිය බිඳක් මෙන්
සිසිල සැනසුම පතුරුවා
සිසිල ඔබ මේ ලොවම සැනසූ
එසේ වුවත් ලොවෙන් සැඟවී
ලොවක් සැනසූ දිය බිඳයි ඔබ
ලොවම ඔබ නොහැඳිනුවත්
ඔබව සැමදා මම හඳුනමි
ඒ ඔබයි ආදර පියාණෙනි....

හෂිණි නයනතාරා පොන්නම්පෙරුම
(අනුරුද්ධ පොන්නම්පෙරුම)

ශිෂ්‍යත්වය ජයගත් අපේ දූ පුතුන්..

පසුගියදා ප්‍රතිඵල නිකුත් වූ පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වූ අප කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දූ පුතුන් අතරින් ශිෂ්‍යත්වය සමත්වූ තවත් දක්ෂ පුතෙකුගේ තොරතුරු අප වෙත ලැබී තිබුණා. HNB ග්‍රාමීන් ෆයිනෑන්ස් ලිමිටඩ් සමස්ත කාර්ය මණ්ඩලයේ සෙනෙහස් සුභාශිංසන සමගින් ඔහුගේ තොරතුරු අප මෙසේ පළ කරමු.

තීක්ෂණ විදුරංග සුගතපාල
ලබාගත් ලකුණු - 158
(නිශාන්ත ප්‍රදීප් සුගතපාල - අනුරාධපුර)

2016 HNB

ග්‍රාමීන් ප්‍රධාන කාර්යාලීය සුහද හමුවෙහි විචිත්‍ර මතක අතර

HNB ග්‍රාමීන් සමාගමේ ප්‍රධාන කාර්යාලයේ වාර්ෂික සුහද හමුව මෙවර පැවැත්වුණේ 2016.12.09 දින නාවල කොස්වත්තේ ඔපියුලන්ට් රිවර් ෆේස් හෝටල් පරිශ්‍රයේදීය. HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත්, අධ්‍යක්ෂිකා ක්‍රිෂාන්ති තම්බයියා සහ ප්‍රධාන මෙහෙයුම් නිළධාරී ප්‍රියලාල් අරංගල යන මහත්ම මහත්මීන්ගේ ගෞරවනීය සහභාගීත්වය ඇතිව පැවැත්වුණු මෙම සුහද හමුව සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, සහකාර සාමාන්‍යාධිකාරිවරුන්, ප්‍රාදේශීය කළමනාකරුවන් ඇතුළු ප්‍රධාන කාර්යාලයේ සියළුම සේවක මහත්ම මහත්මීන් සහභාගී වූහ. මෙම සුහද හමුවෙහි රසාලිප්තබව HNB ග්‍රාමීන් සමාගමේ ඒ ඒ අංශයන් මඟින් ඉදිරිපත් කළ විචිත්‍රාංගයන්ගෙන් වඩාත් රසගැන්විණි. එදින සවස සිට මැදියම් රැය ගෙවී යන තෙක් පැවැත්වුණු මෙම සුහද හමුවෙහි විචිත්‍ර මතකයන් රැසක් නිර්මාණ ගුණසේකර මහතාගේ කැමරා ඇසට හසුවූයේ මෙසේය.

- ජායාරූප -
නිර්මාණ ගුණසේකර

ඔබ (NO)දන්න මම

ග්‍රාමීන් එකට එන කොට මට තිබුණේ ෆුට් සයිකලයක් විතරයි.

අජිත් ප්‍රියන්ත -ප්‍රාදේශීය ගණකාධිකාරී

- **සම්පූර්ණ නම :-** කිරිහීගනගේ අජිත් ප්‍රියන්ත
- **උපන්දිනය (කැමතිනම්) :-** 1977.08.23
- **පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම**
- **පාසැල :-** මගේ අම්මා තාත්තාගේ ගම් පළාත වුණේ මාතර, තාත්තා ධීවර රස්සාව කරලා තමයි අපිව ජීවත් කළේ.1970 ආණ්ඩුවෙන් ධීවර කර්මාන්තයේ නියැළුණු අයට ත්‍රිකුණාමලයෙන් ඉඩම් ලැබුණා. අපි ත්‍රිකුණාමලයේ පදිංචියට ගියේ එහෙමයි. තවමත් ත්‍රිකුණාමලයේ ජීවත්වෙන සිංහල මිනිස්සුන්ගෙන් 90% ක්ම ගාල්ල මාතර පැතිවලින් ආපු අය. මේ නිසා පුංචි කාලෙ ඉඳලම මගේ ගම වුණේ ත්‍රිකුණාමලය. සිංහල දෙමළ මිනිස්සු මැද්දෙ මම හැදී වැඩුණා. මගේ මුල්ම පාසැල වුණේ ත්‍රිකුණාමලයෙ රාජකීය විද්‍යාලෝක මහා විද්‍යාලය. සාමාන්‍ය පෙළ වෙනකම් මම ඒ පාසැලේ ඉගෙන ගත්තා. ඒ පාසැලේ විද්‍යා විෂයන්ගෙන් උසස්පෙළ කරන්න නොහැකිවීම නිසා මම ත්‍රිකුණාමලයේ සිංහල මධ්‍යමහා විද්‍යාලයට ඇතුලත් වුණා. කොහොම වුණත් මම වඩාත් කැමතියි රාජකීය විද්‍යාලෝක මහාවිද්‍යාලයේ ඉගෙන ගත්තු ඒ ළමාකාලයට.
- **විෂය :-** විද්‍යාව
- **ක්‍රීඩාව:-** වල්ලේ, කවපෙත්ත, යකුලිය විසි කිරීම වගේ ක්‍රීඩාවලට මම කැමතියි. පාසැල් මට්ටමේදී මේ ක්‍රීඩාවන් වලින් ජයග්‍රහන දිනා ගන්න මට පුළුවන් වුණා
- **පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ:-** ලොකු වුණාම කරන රස්සාව ගැන අදහසක් ඒ කාලෙ මට තිබුණෙනෑ. ඒත් ත්‍රිකුණාමලයේ ප්‍රීමා,මිටිෂුයි වගේ කම්හල් නිසා ඒ වගේ ආයතනයක රසායනාගාරයේ පර්යේෂකයෙක් විදිහට රැකියාවක් කරන්න තියෙනවානම් කියලා හිතිලා තිබුණා.
- **මුල්ම රැකියාව එක සහ වඩාත්ම ආශාවෙන් කළ රැකියාව :-** උසස් පෙළ කරලා මාස අටක් විතර ගෙදර හිටියා. ඒ කාලේ මම ගෙදර සිල්ලර කඩයක් කළා. ඔය අතරෙ ත්‍රිකුණාමලයෙ එකවුන්ටන්ට් විදිහට කටයුතු කළ ප්‍රසන්න මට කතා කළා ඇසිස්ටන්ට් එකවුන්ටන්ට් කෙනෙක් විදිහට එන්න කියලා. බණ්ඩාරගම සති දෙකක පුහුණුවකින් පස්සෙ 2003 ඔක්තෝබර් 13 මුල්ම පත්වීම ත්‍රිකුණාමලය ශාඛාවට ලැබුණා. එදා ඉදන් අද දක්වා මම ග්‍රාමීන් සමාගමේ මගේ රැකියාව ඉතා කැමැත්තෙන් කරනවා.
- **ජීවිතේ අමතක නොවන සිද්ධිය :-** 2004 සුනාමි ව්‍යසනය. එදා නිවාඩු දවසක් වුණත් අපි ඔෆිස් එකේ හිටියා. ශ්‍රී කාන්තන් ඇවිත් මුහුදු ගොඩ ගලන ආරංචිය කිව්වාම අපි පාර පැත්තට ගියා බලන්න. බෝට්ටු උඩින් යනහැටි, රළපාර වේගයෙන් ගොඩබිම දිහාට එන හැටි දැක්කාම උන්හිටි තැන් අමතක වෙලා බයිසිකලුත් දාලා අපි උඩහට දිව්ව හැටි කවදාවත් අමතක වෙන්නේනෑ.
- **ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය:-** 2009.10.08 වෙනිදා මගේ දුව තිනෙලි ඔනෙත්රා දහම්සි උපන් දවස. එදා මට දැනුණු අසීමිත සතුට වචනයට නගන්න බෑ. ඒත් විශේෂ දුකක් දැනුණු දවසක් නම් මගේ මතකයට එන්නේ නෑ.

ළමා වියත් යොවුන්වියත් අතර ගෙවුණු සුන්දර යුගයක් විදිහට ඒ කාලය ගැන මගේ මතකයේ නාම තියෙන්වා.

- **අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව :-** පාසැල් කාලය. ඒකෙනුත් සාමාන්‍ය පෙළ පංතියේ ගත කළ කාලය. මං හිතන්නෙ පාසැල් ජීවිතේ ගැන බරක් පතලක් දැනුණු කාලය වගේම ළමා වියත් යොවුන්වියත් අතර ගෙවුණු සුන්දර යුගයක් විදිහට ඒ කාලය ගැන මගේ මතකයේ තියෙනවා.
- **ජීවිතයට අහිමිවුණු වටිනාම පුද්ගලයා හෝ අවස්ථාව :-** එහෙම විශේෂ පුද්ගලයෙක් හෝ අවස්ථාවක් නෑ. මම බලාපොරොත්තු වුණු හුගක් දේවල් මට ලැබිලා තියෙනවා.
- **හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා :-** මම මිනිස්සුන්ව හුගක් විශ්වාස කරනවා. එහෙම විශ්වාස කරලා අමාරුවේ වැටුණු අවස්ථාත් ඕන තරම් තියෙනවා. ඒත් තවම ඒ දුර්වලතාව හරි ගස්සා ගන්න පුළුවන් වෙලා නෑ.
- **ඔබ හිතන විදිහට ඔබ වඩාත්ම කුසලතාවන් ප්‍රකට කරන්නේ:-** මම කුසලතා දක්වන අංශයෙන්ම මගේ රැකියාව ලැබිලා තියෙනවා.
- **ඔබේ ජීවිතයේදී හමුවූ වඩාත්ම ආකර්ශනීය පුද්ගලයා, ඔහු තුළ ඔබ දකින සුවිශේෂීතාවය:-** අම්මා. ඇය උත්සාහවන්තයි ධෛර්යවන්තයි. නිසි කළමනාකාරිත්වයකින් යුතුව කටයුතු කිරීමේ හැකියාව ඇයට තියෙනවා.
- **පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම :-** පන්සලේදී දැකපු ගෑණු ළමයෙක් ගැන මගේ හිතේ හැඟීමක් ඇතිවුණා. එයත් එක්ක කතා බහකරලා මම ගෙදරටම ගිහින් එයාගේ අම්මා තාත්තගෙන් ඇහැව්වා. මගේ ඒ නිර්හිතකමේ ප්‍රතිඵලය වුණේ ඇය මගේ බිරිඳ වීම.

- **එම පුද්ගලයාගේ ඔබ දකින සුවිශේෂතාව :-** ඇය දිල්හාරා සෙව්වන්දි. මුලින්ම මගේ හිත ගත්තේ එයාගෙ ලස්සන. ඇගේ බුද්ධිමත් බව වගේම පිළිවෙලටත් මම කැමතියි. මුලින් ඇය රැකියාවක් කළත් දැන් මුළු කාලයම ගෙදර දොරේ කටයුතු වලට වෙන් කරලා තියෙන්නෙ.
- **ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද :-** අනිවාර්යයෙන්ම,මම ග්‍රාමීන් එකට එන කොටමට තිබුණෙ ෆුට් සයිකලයක් විතරයි. අද වෙද්දි ඉඩම් අරන් ගෙවල් දොරවල් හදලා වාහන අරන් ජීවිතේ සතුටින් ගෙවන්න මට පුළුවන්වෙලා තියෙනවා. මේ හැමදේම මම ඉපැයුවේ ආයතනයට අවංකව මගේ සේවය සපයලා ඉපැයූ වැටුපෙන්. ඇත්තටම මම මගේ ජීවිතේ ගැන තෘප්තිමත්
- **ඔබේ ජීවිතය වෙනස් කළ හැරවුම් ලක්ෂය (Terning Point):-** ග්‍රාමීන් සමාගමේ රැකියාවට ඒම. කිසිම දෙයකින් ආපස්සට නොගිහින් වැඩ කිරීමේ හැකියාව මේ රැකියාවෙන් ලැබුණා.
- **ඔබ ඔබව දකින්නේ:-** නිහඬ චරිතයක්. කාටත් උදව්කරන්න කැමැතියි. පැත්තකට වෙලා ඉඳගෙන හැමදේම නිරීක්ෂණය කරන්න තමයි වඩා කැමති
- **ඔබේ ප්‍රියතම**

ගායකයා :- සුනිල් එදිරිසිංහ

ගීතය :- මේ තරම් සියුමැලිද කළුගල්

චිත්‍රපටිය :-The maze Runner

කෘතිය :- පොත් කියවීම නම් ටිකක් අඩුයි.

- **අනාගත ඉලක්කය :-** කාටවත් කරදරයක් නැතිව බිරිඳ දරුවො එක්ක සතුටින් ජීවත්වෙන එක තමයි.

මංජුල ප්‍රභාත්

සර්ව සුභවාදීව සිතීමෙන් බොහෝ අවස්ථා උදාකර ගතහැකිය.

ග්‍රාමීන් සමාගම පිළිබඳව පණිවිඩය ජනතාව අතරට ගෙනයාමම සමාජ මෙහෙවරක්....

- ශ්‍රියානි කරුණාරත්න -

එකතු කර ගත් එළකිරි මනාව අසුරන ලද බදුන් වල පුරවා ඒවා කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙත උදැහැනැක්කේම ගෙන ගොසින් දෙන මහින්ද යළි නිවස කරා පැමිණෙන තුරු ශ්‍රියානිට ඇත්තේ කලබලයකි. අද නැකැත් දවසක් බැවින් මුහුණ හා ඇදුම් ආයිත්තම් හැඩගන්වා ගැනීමට පැමිණෙන යුවතියන්ගෙන් රූපලාවණ්‍යාගාරය පිරිගොස්ය. ඒ අතර අනෙක් පසින් වූ කඩයට බඩු ගන්නට පැමිණ සිටිනවුන්ගේ වුවමනාවන් සපුරාලීමට සිදුව තිබෙන්නේත් ඇයටමය. කොතෙක් වැඩ තිබුණ ද පැමිණ සිටින්නවුන් හිස්අතින් හරවා යැවිය නොහැක. එය ඇයගේ ව්‍යාපාරික ප්‍රතිපත්තිය ද නොවන බව පැහැදිලිය. ට්‍රැක්ටරයේ නැගී උදයේම දෛනික රජකාරියට ගිය සැමියා සාමාන්‍යයෙන් උදේ 9-10 අතර යළි නිවසට පැමිණිය යුතුය. මේ කලබලයෙන් මිදී එක තැනක සිට සිය රාජකාරියෙහි යෙදෙන්නට ඇයට හැකිවන්නේ එවිටය.

මේ අනුරාධපුර වනමල්ගොල්ලෑවේ පදිංචි ශ්‍රියානි කරුණාරත්නගේ දෛනික ජීවන රටාවේ සාමාන්‍ය ස්වරූපයයි. ජීවිතය ජය ගැනීමේ අප්‍රතිහත ධෛර්යයෙන් ඔද ගැන්වුණු මේ අපූරු ව්‍යාවසායිකාව සිය දිවි සැරියේ අතීත වතගොත අප හමුවේ හෙළි පෙහෙළි කළේ මෙලෙසිනි.

මගේ ගම මැදවච්චියේ හැලඹගස්වැව කියන ප්‍රදේශය. තාත්තාගේ රුකියාව වුණේ ධීවරයින්. අම්මා රස්සාවක් කළේ නෑ. මැදවච්චිය මධ්‍ය මහා විද්‍යාලයේ උසස්පෙළට වෙනකම් මම ඉගෙන ගත්තා. පාසැල් අධ්‍යාපනයෙන් පස්සේ මම අනුරාධපුරයට ගිහින් රූපලාවණ්‍ය සම්බන්ධයෙන් මාස 6 ක පාඨමාලාවක් කළා. ඔය කාලෙම තමයි මම විවාහ වුණෙත් මහත්තයා නෙස්ලේ සමාගමේ කිරි ප්‍රවාහන අංශයේ සේවය කළා. උදේ වරුවේ කිරි එකතු කිරීම ඉවරවෙන නිසා ඉන්පස්සේ මහත්තයාට වී හැටි වැඩක් තිබුණේනෑ. අපි හිතුවා පොඩියට කඩයක් පටන් ගන්න. කඩේ ආරම්භ කරන කටයුතු වලට අවශ්‍ය මුදල් හොයාගන්න තමයි මම මුලින්ම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ

වුණේ. ඒ කාලේ ශාඛාව තිබුණේ අනුරාධපුරේ. කනදරාව මධ්‍යස්ථානයට සම්බන්ධ වෙලා මම ණය මුදල් ලබා ගත්තා. කඩයේ වැඩ කටයුතු කෙරෙන අතරේම මම හිතුවා මම ඉගෙන ගත්තු රූපලාවණ්‍ය පාඨමාලාවෙනුත් වැඩක් ගන්න ඕන කියලා. කඩයට අල්ලලා මම මගේ රූපලාවණ්‍යාගාරයේ කටයුතුත් ආරම්භ කළා. 'ඒ දිල්කි බියුටි සැලෝන්' නමින්. ඒ 2005 අවුරුද්දේ අන්තිමේ. ඒ කාලෙ මේ පළාතේ එක බියුටි සැලෝන් එකක්වත් නෑ. මම පටන් ගත්තු ඒ ව්‍යාපාරයටත් උදව් කළේ ග්‍රාමීන් සමාගම. මට තවම මතකයි. මම රු. 10,000 ණය මුදලක් ලබාගෙන මනාලියගේ ඇඳුම් සෙට්එක ගත්තා. ඉන්පස්සේ දෙවැනි ණය මුදල විදිහට රු. 15,000 ණය මුදල අරන් මනාලියගේ මාල හත මිල දී ගත්තා. ඒ ව්‍යාපාරෙ සාර්ථකව කරගෙන යන අතරම මට හිතුනා බැටරි චාර්ජරයක් ගන්න. මොකද මේ කාලේ වෙනකොට අපේ ගෙවල් සීමාවෙන් එහාට විදුලිය තිබුණේ නෑ. හුගක් අය රූපවාහිනිය බැලුවේ කාර් බැටරියෙන්. අපි බැටරි චාජරයක් ගත්තාම හුගක් අය බැටරි චාර්ජ් කර ගන්න අපි ළඟට ආවා. ඒ බැටරි චාර්ජරය ගත්තෙත් ග්‍රාමීන් ණය මුදලකින්. ඉන් පස්සේ රු.40,000 හා 60,000 වගේ ලොකු ණය මුදල් අරන් මගේ ව්‍යාපාරවල කටයුතු තව පුළුල් කළා. කුලියට උත්සව භාණ්ඩ ලබාදෙන ආයතනය පටන් ගත්තෙත් එහෙමයි. ඒ සඳහා මම HNB ග්‍රාමීන් එකෙන් ලක්ෂයේ ණය මුදල් දෙකක් ගත්තා.

මේ ආතරෙම මම උපයන ආදායමින් කොටසක් සතිපතා මියුලැසි කාන්තා ඉතුරුම් ගිණුමේ තැන්පත් කරන්න පුරුදු වෙලා ඉන්නවා. ඒ නිසා ලොකු ණය මුදල් වලට යද්දී කිසිම අපහසුවක් නැතිව HNB ග්‍රාමීන් ස්වශක්ති ණය ක්‍රමයෙන් මගේ අවශ්‍යතාවයට අනුව පහසුවෙන්ම ණය මුදලක් ලබා ගන්න පුළුවන්වෙලා තියෙනවා.

මේ වෙද්දී මගේ දුවත් රූපලාවණ්‍ය පාඨමාලාවක් හදාරනවා. ඉදිරියේ දී මේ ව්‍යාපාරයේ වැඩි දියුණුවට එයාගේ සහයත් මම බලාපොරොත්තු වෙනවා.

අපි වගේ පුංචි ව්‍යාපාරිකයින් ඕන තරම් මේ රටේ ඉන්නවා තමන්ගේ ව්‍යාපාර දියුණු කර ගන්න අතදීමක් නැතිව. ඒ වගේ අයට HNB ග්‍රාමීන් සමාගම පිළිබඳව මේ පණිවිඩය ගෙනයා හැකි නම් මම සලකන්නේ එම සමාජ මෙහෙවරක් කියලයි. මගේ ජීවිතයේ මේ තත්වය කරා ඉදිරියට ගෙන එන්න HNB ග්‍රාමීන් සමාගම දැක්වූ අනුග්‍රහයට මුළු හදවතින් ස්තූති වන්ත වෙන අතරෙම මාවගේ තවත් දස දහසක්වූ පිරිසකට ජීවිත ජය ගන්න මාවත විවරකර දීමට HNB ග්‍රාමීන් සමාගමට හැකි වේවායි ප්‍රාර්ථනා කරනවා.

දහම්සා තිසරංගි
ඡායාරූප - ඩිශාන් සමින්ද

ඔබට සිදුවිය හැකි ලොකුම විපතට බිය නොවන්න.

ජය වැඩ අබියස

පහසුවෙන් ණයක් ගන්න ස්වශක්ති ණය ක්‍රමය නිසා දැන් අපට පුළුවන්

ණයමුදලක් ගැනීමේ දී ඇපකරුවන් හෝ වත්කමක් ඇපයට තැබීමක් සිදු කරන්නට වීම බොහෝ ණය ඉල්ලුම් කරුවන්ට මුහුණ පෑමට සිදුවන අසීරු අවස්ථාවක්. මෙවන් අවස්ථා වලදී සිදුවන කල්ගත වීම් සහ අනවශ්‍ය රස්තියාදු අවම කරගත හැකි ණය ක්‍රමයක් HNB ග්‍රාමීන් හදුන්වාදී තිබෙනවා. HNB ග්‍රාමීන් ස්වශක්ති ණය ක්‍රමයට හිමිකම් කීමට නම් HNB ග්‍රාමීන් ඉතුරුම් ගිණුමක හිමිකරුවකු වීම සහ සැලකිය යුතු තැන්පතු මුදලක් එහි පවත්වා ගෙන යාම ප්‍රමාණවත්.

මැදවච්චියේ පුන්සිරි සයිකල් වර්ක්ස් හි අධිපති ඒ. ආර්. කුමාරසිංහ මහතා එසේ එවි. එන්. බී. ග්‍රාමීන් සමාගම සමඟ සම්පව ගනුදෙනු කරගෙන යනු ලබන ගනුදෙනුකරුවෙක්. සිය ව්‍යාපාරයේ උන්නතිය සඳහා ග්‍රාමීන් සමාගමෙන් ලැබුණු රුකුල ඔහු අප හමුවේ විස්තර කළේ මෙලෙසින්.

ඒ. ආර්. කුමාරසිංහ පුන්සිරි සයිකල්ස් නුවර පාර, මැදවච්චිය

මම 1973 ඉඳලා මේ ව්‍යාපාර කරගෙන යනවා. බයිසිකල් විකිණීමත් අලුත් වැඩියා කිරීමත් අපි මෙතැන කරනවා. මම මුලින් වෙනත් බැංකු සමඟ ගනුදෙනු කළත් HNB ග්‍රාමීන් සමාගම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය මුදල් නිකුත් කිරීම ඇරඹීමත් සමඟ මට අවශ්‍ය ණය ග්‍රාමීන් එකෙන්ම ලබා ගන්න මම හුරුවුණා. ඉතාම පහසුවෙන් ණය මුදලක් ගන්න ග්‍රාමීන් ස්වශක්ති ණය ක්‍රමය නිසා දැන් අපට පුළුවන්. අනික ගත්තු ණය මුදලේ වාරික ගෙවන්න කඩේ වැඩ පාඩු කරගෙන මට රස්තියාදුවෙන්න අවශ්‍යත් නෑ. ග්‍රාමීන් එකේ මහත්තුරු අපි ළඟටම ඇවිත් ණය මුදල් එකතු කරනවා.

මුලින්ම අපි අපේ අයියලත් එක්ක එකතු වෙලා තමයි මේ ව්‍යාපාරය කරගෙන ගියේ. ටික කාලයක් යද්දි අපිට හිතුණා වඩේ හදලා අළෙවි කරන එක අපිම වෙනම අපේම ව්‍යාපාරයක් විදිහට කරගෙන යන එක හොඳයි කියලා. එහෙම ආරම්භ කරපු මේ ව්‍යාපාරයට දැන් අවුරුද්දක් විතර වෙනවා. මහත්තයා තමයි ව්‍යාපාරය පාලනය කරන්නේ. මම ඒ සඳහා ඔහුට උපරිම සහාය ලබාදෙනවා. ව්‍යාපාරය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා තමයි අපි ග්‍රාමීන් සමාගමෙන් ණය මුදල් ලබා ගත්තේ. මොකද අපි දවසකට කිලෝ 35 - 40 ක විතර වඩේ හදනවා. ඒ හදන වඩේ විකුණන්න අපේ වෙනම කට්ටියක් ඉන්නවා. ඒ අය ටවුන් එකේ බස්වල වඩේ අළෙවි කරනවා. වඩේ හදන්නත් අපි ළඟ කීපදෙනෙක් ඉන්නවා. කොහොමහරි පුද්ගලයින් 13 ට විතර රැකියා අවස්ථා ලබාදෙන්න මේ ව්‍යාපාරය තුළින් අපට පුළුවන්වෙලා තියෙනවා. ණය වාරික අයකර ගැනීමට වගේම ඉතුරුම් ලබාගන්නත් ග්‍රාමීන් සමාගම අනුගමනය කරන ක්‍රමවේදය අපට ඉතාපහසුවක්.

එම්. එම්. ශාලිකා කුඩාවැව, මැදවච්චිය

ණයක් ගන්න වගේම උපයන මුදල හොඳ පොළියක් එක්ක ඉතිරි කරන්නත් පුළුවන් හොඳම තැන

රත්මල් ගහ වැව පාරේ වැව් රක්ෂිතයට පසුබිම්ව පිහිටි කුඩා කම්හල ගමේ කාගේත් නිසැක අවධානයට පාත්‍ර වන්නේ ගමේ ජීවත් වන්නේ ගොවි තැන ජීවනෝපාය කරගත්තවුන් සමූහයක් වනබැවිනි. රංජිනී සහ ඇගේ සැමියා සිය ජීවනෝපාය සරි කරන්නේ ගම්වාසීන්ට නිරන්තරව අවශ්‍ය වන කැති, උදලු මන්න, දෑකැති, පිහි, හිරමන, ආදි උපකරණ නිපදවීමෙනි.

''අවුරුදු 10 ක් වෙනවා මේ ව්‍යාපාරය පටන් අරන්. මුල් කාලේ මගේ සැමියා ආයුධ හදලා ඒවා අරගෙන පොළට ගෙනිහින් විකුණනවා. කාලයක් යද්දි

ඒ. එන්. රංජිනී කරුවල ගස්වැව, කහටගස් දිගිලිය

ගමේ හැමෝම අපිව හොයා ගෙන අපේ වැඩපළට එන්න පටන් ගත්තට පස්සේ අපිට පොළවල් ගානේ රස්තියාදු වෙලා අපේ නිෂ්පාදන විකුණන්න වුවමනා වුනේනෑ. මහත්තයා කම්හල කරගෙන යන අතරේ මම ඊට අල්ලලා තේ කඩයක් පටන් ගත්තා. මේ සියලුම වැඩ වලදී අපට අත්වැලක් වුණේ HNB ග්‍රාමීන් සමාගමයි. 2007 ඉඳන් මම මේ ව්‍යාපාරවලට ග්‍රාමීන් සමාගමෙන් ණය ගත්තා. 120,000 ණය මුදල තමයි මම ළඟදි ගත්තේ. කිසිම අපහසුවකින් තොරව ණය මුදලක් ගත්තා වගේම අපි උපයන මුදල හොඳ පොළියක් එක්ක ඉතිරි කරන්න පුළුවන් හොඳම තැන විදිහටයි මම HNB ග්‍රාමීන් සමාගම දකින්නේ.

ගන්න ණය මුදල වියදම් කරන විදිහ අනුව තමයි අපේ ඉදිරිය තීරණය වෙන්නෙ

බී. එම්. සුමිත්‍රා දිසානායක තම්මැන්නාව - සිප්පුකුලම

බැලූ මානයක් පුරා අරක්ගත් හරිත වර්ණය හා ගත පිස හමායන සීතල සුළඟ ඔවුන්ගේ ගෙමිදුලට ගෙනාවේ අසිරිමත් බවකි. නිවස පසුබිම් කරගෙන පොළව වසාගෙන සිටිනුයේ රත්පැහැ කරලින් බර වූ මිරිස්වගාවකි. ඉන් ඔබ්බෙන් වූ වට්ටක්කා වැල් සහ බටුපාත්තිය අපූරු වර්ණ සංකලනයක් සිය ඵලදාවන්ගෙන් අප නෙතු අද්දරට ගෙන හැර පෑවාය.

අපි අක්කර 2 1/2 විතර වගාකරනවා. මිරිස්,බටු, කැකිරි, කෙසෙල්, වට්ටක්කා තමයි වැඩිපුර වගා කරන්නේ. මේ වගාවන් කරන්න අවශ්‍ය මුදල අපි හොයාගන්නේ HNB ග්‍රාමීන් සමාගමෙන් දැන් අවුරුදු 6 වෙනවා ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වෙලා. මුලින්ම රු. 40,000 ණය මුදල ගත්තේ ඉන්පස්සේ 50,000 හා 70,000 වශයෙන් ණය මුදල් ලබා ගත්තා. වගාවේ අවශ්‍යතාව මත ණය මුදල් ගන්න නිසාත්. ඒ ගන්න ණය මුදල නිසි කළමනාකරණයකින් යුතුව වියදම් කරන නිසාත් ණය බරින් මිරිකෙන්නේ නැතිව සාර්ථකව ජීවිතයට මුහුණ දෙන්න අපිට පුළුවන්වෙලා තියෙනවා.

තමන්ටත් කුමක් හෝ දෙයක් ඉතා විශිෂ්ඨ ලෙස කලහැකි බව අමතක නොකරන්න.

HNB ග්‍රාමීන්
ශාඛාවක වගතුග
HNB GRAMEEN
මෙහෙවර 09
2017 ජනවාරි - පෙබරවාරි

මැදවච්චිය ශාඛාවේ නිළධාරි මණ්ඩලය

කාංචන බෙලිකුඹුර
ප්‍රාදේශීය කළමනාකරු

අනුරාධපුර නගරය පසු කොට යාපනය හන්දියෙන් හැරෙන අපට ඉන් පසුව හමු වන්නේ කළඹලයෙන් තොර නිසල මංපෙතකි. සදාහරිත ලිය ගොමු හා කෙත් වතු වලින් සුසැදි ගම් නියම් ගම් පසුකොට අපගේ ඉලක්කය කරා ළඟා වන විට මධ්‍යහ්නය උදා වෙමින් තිබිණ. මැදවච්චිය නගරය බැව් කියවෙන නාම පුවරුවලින් මඟ අසාගෙන ඉදිරියට යන අපට මැදවච්චිය ප්‍රධාන බස් නැවතුම් පළ ඉදිරිපිට පිහිටි ග්‍රාමීන් මැදවච්චිය ශාඛාව හමු වෙයි.

මැදවච්චිය HNB ග්‍රාමීන් ශාඛාවක් ස්ථාපනය කෙරෙනුයේ 2005 ජනවාරි 10 දාය. එකල මැදවච්චිය ශාඛාවේ ප්‍රථම විධායක නිළධාරියා ලෙස කටයුතු කළ සුරංග දර්ශන හේරත් මහතා අද වන විට එහි ශාඛා කළමනාකාරවරයාය. ඒ නිසාම ඔහු තරම් මැදවච්චිය ශාඛාවේ වග විත්ති විමසන්නට සුදුස්සකු තවත් නොමැති තරම්ය.මැදවච්චිය ශාඛාවේ ආරම්භය පිළිබඳව සුරංග මහතා අප හමුවේ ඒ අතීත තොරතුරු හෙලි කළේ මෙසේය.

මැදවච්චිය ශාඛාවේ මෙහෙයුම් කටයුතු ආරම්භ කළේ මම බදුල්ලෙන් මාරුවීමක් ලබා මැදවච්චියට ඒමත් එක්කයි.අපි මුලින්ම ගෙයක් කුලියට අරන් එතැන තාවකාලිකව ශාඛාව පවත්වා ගෙන යමින් මුල්ම මධ්‍යස්ථානය මැදවචච්චිය 1 නමින් ආරම්භ කළා. මැදවච්චිය ශාඛාවේ මුල්ම කාර්ය මණ්ඩලය පස් දෙනයි. 2005 ජනවාරි 10 ඉඳලා මාස හයක් විතර ණය මුදල් නිකුත් කළාට පස්සේ තමයි අපේ ශාඛාව නිල වශයෙන් විවෘත කළේ.

HNB ග්‍රාමීන් ශාඛා ලැයිස්තුවේ 36 වන ශාඛාව වන මැදවච්චිය ශාඛාව මගින් පුළුල් වපසරියක් පුරා විහිදි යන මධ්‍යස්ථාන 205 කට සිය සේවය සපයනු ලබයි. කැබිතිගොල්ලැව, කහටගස්ලියද්ද, හොරොව්පතාන, තිරප්පනේ, මින්හෙට්ටිගම, සාලියපුර, වව්නියාව, දක්වා වූ ප්‍රදේශයක් එමගින් ආවරණය කරනු ලබයි.

මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායාරූප - ඩිශාන් සමින්ද

රනිල් ප්‍රසාද් බණ්ඩාර
ප්‍රාදේශීය ගණකාධිකාරී

සුරංග හේරත්
ශාඛා කළමනාකරු

එරංග ශ්‍රීමාල්
ජ්‍යෙෂ්ඨ විධායක - මූල්‍ය සහ පරිපාලන

ඩබ්ලිව්. සංජීව
සහකාර කළමනාකරු

දමිත් රසංග
කණිෂ්ඨ සහකාර කළමනාකරු - ක්ෂුද්‍ර මූල්‍ය

නිශාන්ත ප්‍රදිප්
කණිෂ්ඨ සහකාර කළමනාකරු - ක්ෂුද්‍ර මූල්‍ය

මැදවච්චිය ශාඛාව

කාර්ය මණ්ඩලය	සාමාජික සංඛ්‍යාව	මධ්‍යස්ථාන
22	3147	205

ජීවිතයට අත්වැලක් සොයන මිනිසුන්ට වාරුවක් වීමේ සතුට අපට තියෙනවා...

මීට අමතරව ගලෙන් බිදුණුවැව අපේ සේවා මධ්‍යස්ථානය මගින් කැකිරාව, ගනේවල්පොල හන්දිය, හුරුළුවැව, ගල්කොළ, හන්දිය දක්වා වූ ප්‍රදේශ ආවරණය කරමින් මධ්‍යස්ථාන 98 ක් පවත්වාගෙන යනවා. මේ පළාතේ ජනතාව වැඩිපුරම නියැලි ඉන්නේ කෘෂිකර්මාන්තය හා බැදුණු ව්‍යාපාරවල. එයිනුත් වී වගාව ප්‍රධානයි. ඊට අමතරව එළවළු වගාව , මිරිදිය ධීවර කර්මාන්තය බහුල වශයෙන් සිදු කරනවා.මේ ව්‍යාපාර වලට සේම අනෙකුත් කර්මාන්ත හා සේවා සපයනු ලබන ආයතන පවත්වාගෙන යාම සඳහා අපේ HNB ග්‍රාමීන් සමාගමෙන් ණය මුදල් ලබා ගැනීමට විශාල ගනුදෙනුකරුවන් පිරිසක් අප වටා ඒකරාශි වී සිටිනවා. ඒ සියළු දෙනා සඳහාම ණය මුදල් ලබාදීම මගින් සහ අපගේ සේවාවන් ලබා දීම මගින් ඔවුන්ගේ ජීවන තත්වය දියුණු කිරීම සඳහා පුළුල් වැඩපිළිවෙළක් අප ක්‍රියාත්මක කරනු ලබනවා.

මෙහිදි ණය මුදල් සහ සේවා සැපයීමට අමතරව අප ගනුදෙනුකරුවන් සඳහා ව්‍යවසායක පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, වෙළෙඳපොළ සොයා ගැනීමට උදව් කිරීම වැනි කටයුතු අප විසින් සිදු කරනු ලබනවා. අප විසින් කරන ලද සමාජ සත්කාරක සේවා මගින් ප්‍රදේශය තුළ HNB ග්‍රාමීන් සමාගම පිළිබඳව ප්‍රසාද ජනක පසුබිමක් නිර්මාණය කිරීමට අපට පුළුවන් වීම සතුටට කාරණයක්.

HNB ග්‍රාමීන් හි තේමා පාඨය වූ අදුර දුරලන සොදුරු මෙහෙවරක් පිළිබඳ වූ සද්ජන අරමුණ තම උපරිම ශක්තිය හා කාලය කැපකරමින් සැබෑවක් කරලන්නට එකාවන්ව වෙහෙසෙන මේ සොදුරු කාර්ය මණ්ඩලයට ඒ අරමුණු කරා පිය නගන්නට හැකි සොදුරු හෙටකට ආසිරි පැතුම් එක්කරලන්නට අප සමග ඔබද එක්වන බව අපට විශ්වාසයි.

ගලෙන් බිදුණුවැව සේවා මධ්‍යස්ථානයේ නිළධාරි මණ්ඩලය

නුවන් සංජීව
සහකාර කළමනාකරු
ගලෙන්බිදුණු වැව - සේවා මධ්‍යස්ථානය

සමන්ත චන්දන
ජ්‍යෙෂ්ඨ විධායක
මූල්‍ය හා පරිපාලන

සඳුන් තුසිත
සහකාර කළමනාකරු - ක්ෂුද්‍ර මූල්‍ය
ගලෙන්බිදුණු වැව - සේවා මධ්‍යස්ථානය

ගලෙන් බිදුණුවැව සේවා මධ්‍යස්ථානය

කාර්ය මණ්ඩලය	සාමාජික සංඛ්‍යාව	මධ්‍යස්ථාන
9	1575	98

ඔබව විවේචනය කරයි නම් ඔබ තුල කුමක් හෝ විශිෂ්ඨ හැකියාවක් ඇත.

කෙටිකතාව

දුගත්කම්

සැදෑ වළාපෙල පෑල දිග අහසේ බැසයමින් තිබිණි. සීතල සුළං රැළි ගතසිත සනසා සෙමෙන් හමායයි. කුරුළු පැටව් කිචි බිචි ගා කැඳලි කරා පියඹායයි. ගමන් මළු අතේ තබා ගත් මිනිස්සු ලහි ලහියේ නිවෙස් බලායති. අතොරක් නැතිව ගමන් ගන්නා රථ වාහන දෙස බලා සිටි දුමින්ද වාඩි වී සිටි ගල් කුලෙන් නැගී සිටියේ හිරු ක්ෂිතිජයේ ගිලෙන්නට ඔන්න මෙන්න තිබියදී ය.

දුමින්දට අතර මඟ දී මුනිච්චි වූයේ ටවුමේ තේ කඩයේ වූ සෝමසිරි මාමා ය.

''ආ! පුංචි බේබි බැහැරක් ගියා වගෙයි.''කියා ඔහු මුව පුරා සිනාවක් පෑවේ ය.

''අනේ ඔව් මාමේ ගෙදර ඉන්න කොටත් කම්මැලී. ඒ නිසාම පොඩ්ඩක් ඇවිදින්නට ගියා''

''හැබෑට පුංචි බේබි කොළඹ ලොකු කොලොපියකට ගිහිල්ලත් තවම රස්සාවක් හම්බවුණේ නැතැයි.''

''ඔහේ නෑ මාමේ අද කාලේ රස්සාවල් හොයන එක කළුනික හොයනවා වගේ අමාරුයි''

''මාමේ කොහොමද? තේ කඩේ රස්සාව,''

''අත පිරෙන්ට නම් ඉතිං ගත මනාව ලැබෙන්නේ නැතෑ.''

''ඒ ඉස්සර පුංචි බේබි දැන් එහෙම නැහැ. මගේ දුවත් පුතාලා දෙන්නාත් මේ රස්සාවට කැමති නැහැ. ලොකු පුතා රට රස්සාවට ගියා. දෙවැනියා ගාමන්ට් එකකට ගියා. කෙලිත් ටවුමේ සාප්පුවක රස්සාව කරනවා. මමත් ලෙඩා දුකා, දැන් ඉතිං ඉස්සර වගේ මහන්සි වෙලා තේ කඩේ වැඩ කරන්න බැහැ. මං මේ කල්පනා කලේ මේ කඩේ විකුණා දාලා ආපහු ගමට යන්න.''

''ගමට යන්න...? ඈ මාමේ තේ කඩේ විකුණනවා නම් මම කැමති ඒකඅරගන්න. මං ළඟ තියනවා සල්ලි ටිකක් ඉතුරු කරපු. අහළ පහළ තේ කඩයකුත් නැති හින්දා මට පුළුවන් ඒක කරන්න.''

''පිස්සු කතා කරනවාද? බේබි මහත්තයා. තේ කඩේ මක්කා කරන්නද?''

''මක්කා කරන්නද?... මමත් කරනවා මාමා කරපු රස්සාවම, නමුත් හැබැයි මාමා කරපු විදිහට නම් නෙමෙයි. පොඩ්ඩක් අලුත් තාලෙට''

''නොකෙරෙන වැඩ කතා කරන්න එපා පුංචි බේබි, මහත්තයාගේ අප්පච්චි ගැනත් මං දන්නවා නෑදෑයෝ ගැනත් මං දන්නවා. මං බේබි මහත්තයලගේ ගෙදර උයන්න ආපු මිනිහා වෙච්චි, මහත්තයාට පුළුවන්ද ගමේ මිනිස්සුන්ට තේ හදන්ට.''

''සෝමසිරි මාමාට ඒ කතන්දර ඕනෙ නෑනෙ. තේ කඩය විකුණනවා නම් මම ගන්නවානෙ. එච්චරයි ගනුදෙනු ගැනයි කතා කරන්න ඕනෑ ඔය අනම් මනම් නෙවෙයි''

''හොඳයි හොඳයි එමුකො වෙලාවක එහෙනම් ගනුදෙනු කතා කරලා හමාරයක් කර ගන්න''



දුමින්ද සෝමසිරි මාමාගේ තේ කඩය මිලට ගත්තේ ය. ඔහු පළමු වෙන්ම සිතුවේ දියුණු වෙන්න නම් අවදානම භාර ගත යුතු බවයි. පරණ ගොඩනැගිල්ල අලුත් වැඩියා කොට, ''මිහිරි තේ කඩේ''නමින් ලොකු පුවරුවක් ද එල්ලුවේ ය. දුමින්ද මේ වැඩයට අත ගසන විට ඔහු විදිහටම සිතන පතන ඔහුගේ කොලු නඩයේ රැකියා විරහිත මිතුරන් කිහිප දෙනෙක්ම එයට සම්බන්ධ වූහ. තවත් මිතුරෝ ඇසුර ද නවත්වා දැමූහ. නවීන තාක්ෂණය යොදා ගත් නිසා තේ කඩයේ වැඩ කලට වේලාවට පිළිවෙලකට සිදුවෙයි.

පළමු වෙනි බාධාව පවුලේ අයගෙනි. දෙවැන්න ආවේ මිතුරන් ගෙනි. තුන්වෙනි බාධාව මලීෂාගෙනි.

''අනේ දුමින්ද මොනවද මේ ඔයා කරන්නේ? ආණ්ඩුවේ හොඳ රස්සාවක් ලැබෙන කල් මේ හිටියා වගේ ඉවසලා ඉන්නකෝ අනේ. දන්නවානේ අපේ අම්මාගේ තාත්තාගේ හැටි''අපි දෙන්නට එකතු වෙන්න දෙන එකක් නැහැයි ඇවිටිලි කළාය. එහෙත් දුමින්ද තම මතයේම එල්බ ගෙන සිටියේ ය. මේ අතර තුර සිය මාමාගේ දරුවකුගේ විවාහ මංගල්‍යය ජයටම පවත්වන්නට සූදානම් වන බව ඔහුට ආරංචි විය.

සොයුරු නෑකමටත් වඩා ළඟැඳි මිතුරෙකු ලෙසින් ඇසුරු කළ නිසා ආරාධනාවක් නොලබාම මංගල දිනයේ දීම ඔහු එහි ගියේ ය.

දුමින්ද දුටු විට නෑයින් කසුකුසු ගාන්නටත් මුහුණුවල් වෙනස්කර ගන්නටත් වූහ. පළමු වෙඩිමුරය පත්තු කළේ ලොකු නැන්දාය. ''වේටර් වැඩට ගෙන්වනවා මිස තේ කඩ කාරයොත් එක්ක කෑම මේසයක වාඩි වෙන සිරිතක් අපේ නැහැ.

''දුමින්ද දෙසම බලාගෙන ඇය කියූවේ කාටත් ඇසෙන්නට ය. දුමින්ද කිසිවෙකුටත් නොදන්වාම එතැනින් හෙමීට මාරුවිය. තම පවුලේ නෑදෑයින් විසින් ඔහුව අත්හරිනු ලැබුවද ඔහුගේ ව්‍යාපාරය දුමින්ද අත් නොහළේ ය.

නගර කිහිපයකම සිය ව්‍යාපාරයේ ශාඛා විවෘත කළ ඔහු සිය ව්‍යාපාරික බුද්ධිය වෙනත් අංශ කරාද විහිදෙව්වේ ය. අතම්ට සරු වන විට සිය ගමනා ගමන පහසු කම් සඳහා නවීන පන්නයේ මෝටර් රථයක් ද සිය ව්‍යාපාර කටයුතු සඳහා වාහන කිහිපයක්ද මිල දී ගත්තේ ය. දුමින්දගේ ප්‍රේම වන්තිය වූ මලීෂා මේ වනවිට විවාහ දිවියට පත්ව දරුවන් ති දෙනෙකුගේ මවක්ව සිටියාය.

ව්‍යාපාරය දළුලා සාරයට වැඩෙන විට ඉවත්ව ගිය නෑයෝ නැවතත් බැලුම් හෙලන්නට වූහ. කෑම මේසයට වාඩි වීම පිළිකෙව් කළ ලොකු නැන්දාගේ නිවසින්ම මංගල යෝජනාවක් ආ විට ඔහු එය භාර ගත්තේ මහන්තත්තකම් ලොකුවට ගත් නෑදෑයින් කෙරේ යටිසිතින් සිනා සෙමිනි.

''රැකියාවල් වල ලොකු පොඩි කම් නෑ''යි. ලොකු මාමා කිව්වේ නැන්දා දෙස බලා මංගල්‍ය කටයුතු අභවර වූවාට පසු කාටත් ඇසෙන්නට ය.

තරංගනී හේවා වසම්
(ජනක බණ්ඩාර - දඹුල්ල ශාඛාව)

HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත් මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරිනි.

ණය මුදලක් නිකුත් කිරීම සඳහා ණය විශ්ලේෂණ වාර්තාවක වැදගත් කම

කුඩා ද මුල්‍ය ව්‍යාපාරයක් සඳහා ණය මුදලක් නිකුත් කිරීමට පෙර ණය භාර නිලධාරියා විසින් අදාල ව්‍යාපාරය හා සම්බන්ධව අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳව මිණුම් දඬු කිහිපයක් ඔස්සේ කරුණු ගෙන හැර දැක්වීමු. ණය භාර නිලධාරියා විසින් ක්ෂෙත්‍ර අධ්‍යයනය මගින් හා සම්මුඛ සාකච්ඡා මගින් ගොනුකර ගනු ලබන තොරතුරු වලින් මුල්‍ය විශ්ලේෂණ වාර්තාවක් පිලියෙළ කර ගනු ලබයි. මෙකී මුල්‍ය විශ්ලේෂණ වාර්තාව මුළුමනින්ම පාහේ සමන්විත වන්නේ සංඛ්‍යාත්මක දත්ත මත බව අමතක නොකළ යුතුය. මෙහිදී ණය භාර නිලධාරියා විසින් මතකයේ තබා ගත යුතු කරුණක් වන්නේ අප කටයුතු කරන්නේ ක්ෂුද්‍ර මුල්‍ය ණය ඉල්ලුම් කරුවන් සමග බව. මෙහිදී ණය ලාභියා විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු මත 100% විශ්වාසයක් තබා ගැනීමට මුල්‍ය ආයතනයකට නොහැකිය. මේ අනුව ණය හිමියන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු මත පදනම්ව සකසනු ලබන ගිණුම් වාර්තා පිළිබඳව ද අපට මුළුමනින්ම විශ්වාසය තැබිය නොහැකිය.

මුල්‍ය විශ්ලේෂණ වාර්තාවක් තුළින් ව්‍යාපාරයක් පිළිබඳව මුලිකව අවධානයට ලක්කරන කරුණු දෙකක් වෙයි

1. ණය ලාභියාගේ ව්‍යාපාරය කොතෙක් දුරට සාර්ථක වකක්ද යන වග

2. ණය ලාභියාගේ ණය නැවත ගෙවීමේ හැකියාව කෙබදුද යන වග.

මෙම තොරතුරු ණය භාර නිලධාරියා ලබා ගනුයේ ක්ෂෙත්‍ර අධ්‍යනයෙන් හා සම්මුඛ සාකච්ඡා ක්‍රමයෙනි. මෙසේ ලබා ගත් තොරතුරු මත ණය භාර නිලධාරියා විසින් සකසනු ලබන මුල්‍ය විශ්ලේෂණ වාර්තාව ප්‍රධාන කරුණු තුනක් මත පදනම් වෙයි.

1. **Balance Sheet**- ශේෂ පත්‍රය
2. **Income Statement** - ආදායම් ප්‍රකාශය
3. **Finical Ratio**- මුල්‍ය අනුපාත

Balance Sheet - ශේෂ පත්‍රය

ශේෂ පත්‍රය එක් නිශ්චිත දිනක ව්‍යාපරයක මුල්‍ය තත්වය ඇගයීම සඳහා සකස් කරනු ලබන ප්‍රකාශනයකි ව්‍යාපරයේ වත්කම් හා වගකීම් පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට ණය භාර නිලධාරියාට මෙතුලින් හැකියාව ලැබේ

Income Statement - ආදායම් ප්‍රකාශය

කිසියම් නිශ්චිත වූ කාලච්ඡේදයක් සඳහා (මාසයක්, කාර්තුවක්, වසරක් ආදී වශයෙන්) ව්‍යාපාරයක දළ හා ශුද්ධ ලාභය/කාර්ය සාධනය /මෙහෙයුම් ප්‍රතිඵලය යන ආදිය හඳුනා ගැනීම සඳහා සකස් කරනු ලබන ප්‍රකාශය ආදායම් ප්‍රකාශය වේ. මෙහිදී මෙය සකස් කරනු ලබන්නේ ව්‍යාපාරයේ ආදායම් හා වියදම් සංසන්දනය මගිනි.

Finical Ratio - මුල්‍ය අනුපාත

මුල්‍ය වාර්තා වැඩි දුර අධ්‍යයනය කිරීම සඳහා එහි ඇතුලත් තොරතුරු සාරාංශ කර පසුගිය තොරතුරු හා සංසන්දනයට මෙන්ම වෙනත් මුල්‍ය තොරතුරු හා සංසන්දනය කිරීම තුළින් ව්‍යාපාරයේ වර්ධනය මැනබැලීම සඳහාද මුල්‍ය අනුපාත භාවිතා කරනු ලබයි.

මෙමගින් යම් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය හා ශේෂ පත්‍රය තුළ ඇතුලත් තොරතුරු අනුපාත විශ්ලේෂනය කිරීම මගින් විකුණුම් වලින් කොපමණ ප්‍රතිශතයක් ලාභ ලබන්නේ ද ලාභයෙන් කොපමණ ප්‍රතිශතයක් වියදම් කරන්නේද වත්කම් වලට සාපේක්ෂව ලාභය කොපමණ ද ලබාගන්නා ණය මුදල නැවත ගෙවීමේ හැකියාව කෙසේද ව්‍යාපාරයේ ද්‍රවශීලතාවය කොපමණ ද ප්‍රාග්ධනයෙන් ණය ලබාගෙන ඇති අනුපාතය කොපමණ ද ආදී වශයෙන් ව්‍යාපාරයේ තත්වය පිළිබඳව අභ්‍යන්තර මුල්‍ය තොරතුරු විශ්ලේෂණය කර ගැනීමේ හැකියාව ණය නිලධාරියාට ලැබේ. මේ තුළින් ව්‍යාපාරයේ මුල්‍ය හැකියාව පිළිබඳ නියාමාකාරයේ අවබෝධයක් සහ ණය ඉල්ලුම් කරුට ලබාදිය යුතු ණය ප්‍රමාණය කොපමණක් ද යනාදිය පිළිබඳ නිසි තක්සේරුවක් ණය භාර නිලධාරියාට ලබා ගත හැකිය.

පුරුද්ද වලක්වා ගැනිමට නොඉක්මන් වුවහොත් සැනෙකින් එය අවශ්‍යතාවයක් වන්නේය.

ඩේලිකානගීගේ
How to win Friends & Influence People
කෘතියේ සිංහල පරිවර්තනය

ඔබගේ ගෙම්දුල අපිරිසිදුව තිබියදී අසල්වැසියාගේ වහලයේ රැඳි සුදු හිම ගැන පැමිණිලි නොකරන්න.

ධවල මන්දිරයෙහි බිත්තියක ලින්කන්ගේ විශාල රූවක් එල්ලා තිබේ. එය ඇත්තේ ඇමෙරිකානු ජනාධිපතිවරයාගේ කාර්යාල කාමරයෙහි ඔහුගේ මේසය ඉදිරියෙහිය. තියොදෝර් රූස්වෙල්ට් එරට ජනාධිපතිකම දරද්දි එක්තරා ව්‍යාකූල තත්වයකට මුහුණ දෙන්නට සිදු විය. රූස්වෙල්ට් ගත යුතු තීරණයක් පිළිබඳව සිතමින් තම කන්තෝරු කාමරයට වැද සිටියේය. සැනකින් ඔහුගේ නෙත ගැටුනේ ලින්කන්ගේ සිතුවමයි.

මේ විදිහේ ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිදු වුණා නම් ලින්කන් ගන්න තීරණය මොන වගේ වෙයිද?

රූස්වෙල්ට්ට සිතුණි.ලින්කන් ප්‍රශ්න වලට මුහුණ දුන්නේ එය මැදහත් සිතකින් සොයා බැලිමෙනි.ඒ අනුව කටයුතු කිරීමෙන් ඕනෑම ප්‍රශ්නයකට විසඳුම තමා ලඟ බව රූස්වෙල්ට් පවසා තිබේ.ප්‍රකට ඇමෙරිකානු ගත්කරුවෙකු වන මාර්ක් ට්වේන්ද බොහෝ දෙයට කෝපව එයට අදාල පුද්ගලයන්ට දෝෂාරෝපණ ලිපි ලිවීමේ පුරුද්දක් තිබුණු අයෙකි.එහෙත් ඔහු තුළ වූ තවත් හොඳ පුරුද්දක් වූයේ එම ලිපි තමාම කියවා බලා ප්‍රුළුස්සා දැමීමය.

වරක් මාර්ක් ට්වේන් පුවත් පත් කතුවරයෙකුට ලිපියක් ලිවේ එම පුවත්පතේ සෝදුපත් බලන්නාට චෝදනා කරමිනි.එයට හේතු වූයේ එම සෝදු පත් බලන්නා මාර්ක් ට්වේන්ගේ අක්ෂර වින්‍යාශය හා විරාම ලකුණු යෙදීම පිළිබඳව ඔහුට අවබෝධ කර දෙන්නට උත්සහ දැරීමයි.

මුලින්ම ඔබ මගේ අත් කොපිය හා මුද්‍රණය කළ පිටුව සසඳා බලන්න.දෙවනුව ඔබ ලග වැඩ කරන පිස්සාගේ මොළයේ මළකඩ ඇති බව තේරුම් ගන්න.

මෙම දෝෂාරෝපණ ලිපිය ලිවීමෙන් මාර්ක් ට්වේන් ගේ සිතට මහත් සැනසීමක් ලැබුණි.එයින් ඔහු සිත උපන් අධික කෝපයද පහව ගියේය.නමුත් එම ලිපිය පුවත්පත් කතුවරයාට යැවීමෙන් සෝදුපත් කියවන්නාට හෝ මාර්ක් ට්වේන්ට හෝ කිසිදු හානියක් සිදු වූයේ නැත.එයට හේතු වූයේ ඔහුගේ බිරිඳ එම හසුන තැපෑලෙන් සොරකම් කර ගැනීමයි.

මෙවැනි විවේචන සහ දොස් පැවරීම තුළින් අන්‍යයෙකු නිවැරදි පුද්ගලයෙකු බවට පත් කළ හැකියැයි ඔබ සිතන්නේද? ඔබ එසේ සිතන්නේ නම් එය ඉතා අපුරු සමාජ මෙහෙවරකි.වසර ගණනක් ගත වෙද්දි වැරදි කරන්නන්ගෙන් තොර සමාජයක අපට ජීවත් වීමට ඉඩ සැලසෙනු ඇත.නමුත් මෙතෙක් එය සිදු වී නැත.

නමුත් විවේචනය කිරීම සහ දොස් පැවරීම තුළින් ලොවින් වැරදිකරුවන් තුරන් කිරීමේ වෑයම ඔබ ආරම්භ කළ යුත්තේ ඔබ තුළිනි.

එසේ කිරීමෙන් සිදු වන හානියද අඩුය. අනෙකුත්ව නිවැරදි පුද්ගලයන් බවට පත් කරනවාට වඩා වැඩි ප්‍රතිඵලයක් ඇත්තේ මුලින්ම තමා ඉතාමත්ම නිවැරදි වීමයි.එසේ සැවොම කටයුතු කරද්දි සමාජය නිවැරදි වන්නේ නිරායාසයෙනි.ප්‍රකට දාර්ශනිකයකු වූ කොන්ෆියුසියස්ගේ මෙම නියමය ඔබගේ සිතට ගැනීම මෙහිදී බොහෝ වැදගත්ය.

''ඔබගේ ගෙම්දුල අපිරිසිදුව තිබියදී අසල්වැසියාගේ වහලයේ රැඳි සුදු හිම ගැන පැමිණිලි නොකරන්න''.

තරුණ වියේදී මා තුළ පුදුම ආශාවක් ඇති විය.ඒ මා පිළිබඳ අන්‍යයන්ගේ සිතෙහි ප්‍රබල ප්‍රතිරූපයක් ඇති කිරීමයි.ඒ සඳහා මා බොහෝ පණ්ඩිත සේම අනුවණ ලිපි රැසක්ම නමක් දිනා ඇති පුද්ගලයන්ට යවා ඇත්තෙමි.ප්‍රවීන ලේඛකයන්ගේ වත ගොත ඇතුළත් ලිපියක් සගරාවකට ලියන්නට තරුණ වියේදී මම උත්සහ කළෙමි.ඒ අතර රිචර්ඩ් හාර්ඩින්ග් ඩෙවිස් නම් ලේඛකයා ද විය.විචාරක මතයට අනුව ඇමෙරිකානු සාහිත්‍යකරුවන් අතර ඔහුද හිදි.මා ඔහුට හසුනක් යවමින් ඉල්ලා සිටියේ සාහිත්‍යකරණයේදී ඔහු අනුගමනය කරන පිළිවෙත් මට දන්වන ලෙසය.

එම ලිපිය ලිවීමට සති කිහිපයකට පෙර මා ලද

හසුනක පහලින් ''කියවන විටදී ලියුවා මිස කියවා නැත''.යන්න සඳහන්ව තිබුණි. කුමන හේතුවකින් හෝ එම වැකියට මා සිත බොහෝ බැඳුණි.එහෙයින් ප්‍රවීන සාහිත්‍යධාරියාට ලියූ හසුනෙහි යටින් එයද සඳහන් කළෙමි.විශේෂයෙන්ම මට උවමනා වූයේ බොහෝ කාර්ය බහුල සේම , බොහෝ වැදගත් එම ලේඛකයාගේ අවධානය මා වෙත යොමු කරවා ගැනීමයි.

කෙසේ හෝ මට පිළිතුරු ලිපියක් ලියන්නට ඔහු පමා කළේ නැත. ඔහුගේ ලිපිය යටින්ද මා මෙන්ම යම් වැකියක් ලිවීමට ඔහු අමතක කර නොතිබිණි.

''ඔබේ බොහෝ වැරදි පුරුදු ප්‍රමාණය ඉක්මවා යන්නේ, ඔබේ වැරදි පුරුදු තුළින්මයි''.

සැබවින්ම මගේ මෝඩ සටහනට එය කදිම පිළිතුරකි. එමෙන්ම ඔහු මට කළ පුංචි අපහාසයද මා විද දරා ගත යුතුමය. නමුත් මනුෂ්‍ය ස්වභාවයට අනුව මම ඔහු කෙරෙහි අමනාපයක්ද ඇති කර ගත්තෙමි.රිචර්ඩ් හාර්ඩින්ග් ඩෙවිස් මිය ගියේ එම සිදු වීමෙන් දස වසරකට පසුවය.ඔහු මිය ගිය පුවත දැන ගන්නට ලැබීමත් සමගම මාගේ අමනාපය යළින් ඉස්මතුව ආවේය.බොහෝ කලකට පසුවද මට සිතුණේ. රිචර්ඩ් හාර්ඩින්ග් ඩෙවිස් මට ලැජ්ජා කළා නොවේද යන්නය.

අප අන්‍යයෙකු විවේචනය කිරීමෙන් හෝ අන්‍යයෙකුට දොස් පැවරීමෙන් හිමි කර ගන්නේ කුමක්ද?අමනාපය පමණක් එයින් ඉතිරි වේ. ඒ අමනාපය හෙට ද ඉතිරි වනු ඇත.විටෙක එය වසර දහයක් පමණ හෝ අපේ මරණය තෙක්ම විහිදී යයි.එයට අමතරව ඒ තුළින් අප සියුම් මිහිරක් ආශ්වාදනය කරනු ලබයි.මිනිස් සිත අත්විඳින ඒ තාවකාලික ආශ්වාදය හේතුවෙන් අපේ විවේචනය කෙතරම් සාධාරණද යන්න පවා අපට අමතකව යයි.

වාසනා ලියනආරච්චි

Atlas සිත්තර යාළු

මෙහෙවර 13
KIND GRAMEEN
2017 ජනවාරි - පෙබරවාරි

පුංචි අපේ චිත්‍ර පිටුව

''සිත්තර යාළු'' චිත්‍ර පිටුව වෙන්වෙලා තියෙන්නේ එච් එන් බී ග්‍රාමින් කාර්ය මණ්ඩලයේ ඔබේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළි දැක්වීම පිණිසයි. ''සිත්තර යාළු චිත්‍ර පිටුවෙහි පළවන චිත්‍ර අතරින් **තෝරා ගනු ලබන හොඳම චිත්‍ර තුනක් සඳහා සිලෝන් පෙන්සිල් කොම්පැනි (ඇට්ලස්) මගින් පිරිනමනු ලබන වටිනා ත්‍යාග කට්ටල තුනක් පිරිනමනු ලබන** අතර ඔබගේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළිදක්වාලීමට ලැබෙන මේ මාහැඟි අවස්ථාව ප්‍රයෝජනයට ගෙන **ඔබේ දරුවාගේ චිත්‍ර නිර්මාණ සංස්කාරක, චිත්‍ර පිටුව, එච් එන් බී ග්‍රාමින් ගොඩනැගිල්ල, අංක 168, නාවල පාර , නුගේගොඩ. යන ලිපිනයට නොපමාව යොමු කරන්න.**

ගෙවත්ත
ටී එම් සෙතුමි සුතාරා දම්සිරි - පෙර පාසල්
(ටී එම් ප්‍රේමලාල් - හලාවත ශාඛාව)

මා දුටු වෙල්යාය
උතුල් බුද්මිණ තන්ත්‍රිගේ - 2 ශ්‍රේණිය

සොබහාදහමේ අසිරිය
එම් නිරංජලා
(කේ ඥාණදේවි - වැලිමඩ ශාඛාව
කිමෙනාගම මධ්‍යස්ථානය)

වගුරු බිමක්
එම් නිරෝෂා - 10 ශ්‍රේණිය
(කේ ඥාණදේවි - වැලිමඩ ශාඛාව
කිමෙනාගම මධ්‍යස්ථානය)

ඇඹුල ගෙන එන ලදුන්
එම් එම් ඒ ෂෙහානි හංසනා - 6 ශ්‍රේණිය
(හිට්ටඹුව ශාඛාව)

"Atlas සිත්තර යාළු"

මෙහෙවර ඔක්තොම්බර් - නොවැම්බර්
කලාපයේ ජයග්‍රාහී දු පුතුන්

- වැඩිහිටියන්ට පිහිට වෙමු
  නේත්‍රා අබිමානි දිසානායක
- මුව රංචුව
  ඉසුක අමෝධ්‍ය ද සිල්වා
- අපේ පාසැල් වත්තේ ශ්‍රමදානයක්
  දිනිති ඉමාෂා අබේසේකර











නියම ජයග්‍රහණය නොවැටී සිටීම නොව, වැටෙන විට නැඟී සිටීමය.



ව්‍යවසායක්ත්වය පිළිබඳව වූ ලිපි මාලාවේදී මින් පෙර කලාපයේදී (මෙහෙවර මැයි - ජුනි කලාපය බලන්න) ප්‍රබල ව්‍යවසායකයකු වූ ඇපල් සමාගමේ නිර්මාතෘ ස්ටීව් ජොබ්ස්ගේ ජීවිත කතාවෙන් උදාහරණ ගනිමින් ව්‍යවසායකුගේ චර්යා රටාව පිළිබඳව යම් අදහසක් ලබා ගැනීමට අපි උත්සාහ කළෙමු. මේ එහි දෙවන කතාවයි. මෙහිදී අප අවධානයට ලක් කරනුයේ ව්‍යවසායකයකුට මුහුණ දීමට සිදුවිය හැකි අවධානම් මොනවාද යන්න සහ ඊට මුහුණ දී එය ජය ගැනීමට ඔහු තුළව ඩවා ගත යුතු ගුණාංග මොනවාද යන්න පිළිබඳවයි.

අහිමිවීම සහ නැවත ලබාගැනීම

මම ඇලුම් කළ දේ, මා අපේක්ෂා කළ දේ මට මගේ ජීවිතයේ හොඳම වයසේදි එනම් මගේ තරුණ වියේදි මට ලබා ගන්නට හැකිවුණා. මම ඇපල් සමාගම ආරම්භ කළේ වයස අවුරුදු 20 දී. මගේ දුප්පත් දෙමාපියන්ගේ ගරාජයෙන් ආරම්භ කළ ඇපල් මැකින්ටොෂ් පරිගණක නිෂ්පාදනය වසර 10 ක් වනවිට ඇමරිකානු ඩොලර් මිලියන 2 ක වත්කමක් ඇති සේවකයන් හාරදහසක් පමණ ඇති දැවැන්ත ආයතනයක් බවට පත් කරන්නට හැකිවුණා. මම මේදේ ලබා ගත්තේ දිවා රෑ නොමැතිව කැපවීමෙන් වැඩකිරීමෙන්. මගේ ආයතනයේ ඉදිරිපත්වූ හොඳම නිෂ්පාදනය මැකින්ටොෂ්. එය වෙළෙඳපලට නිකුත් කර වසරක් යන්නට මත්තෙන් මගේ සමාගමෙන් මම ඉවතට විසිවුණා. මේ වනවිට මගේ වයස අවුරුදු 30 යි. ඔබ සිතාවි මා ආරම්භ කළ ඇපල් සමාගමෙන් මම ඉවතට විසිවුණේ කොහොමද? කියලා. මගේ සමාගම දිනෙන් දින දියුණුවෙද්දී මම එක පුද්ගලයකු මගේ සේවයට බඳවා ගත්තා. මම හිතුවේ ඔහුගෙන් මාගේ දියුණුවට විශාල මෙහෙයක් ලබා ගන්න පුළුවන්වෙයි කියලා. ඇත්තටම මුල්වසර දෙක තුන තුළ දී එමදේ සිදුවුණා. නමුත් පසුව අප අතර මත ගැටුම් ඇතිවුණා. එක් අවස්ථාවක දී එනම්, මගේ වයස අවුරුදු 30 පමණ වන විට සමාගමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය ඔහුගේ පැත්තට පක්ෂග්‍රාහිව ක්‍රියා කළා. එහි ප්‍රතිඵලය වුයේ මට සමාගමෙන් ඉවත්වීමට සිදුවීමයි. තමන් පණ මෙන් ආදරය කළ සමාගමෙන් ඉවත් වීමට සිදුවීම කෙනෙකුට කෙතරම් අපහසුවක්ද දරා ගත හැකි දෙයක්ද යන්න ඔබට වැටහෙනවා ඇති. මාගේ අනාගතයම විනාශ වෙනවා වගේ දැනුණා. ව්‍යාපාරික ක්ෂේත්‍රයේ හිණි පෙත්තට නැග ගෙන ආ මට මගේ අතින් යෂ්ටිය ගිලිහෙනවා වගේ දැනුණා. ඒත් මම ඇපල් සමාගමට,මා බිහි කළදේට ආදරය කළා. මම නැවත ඇපල් සමාගම සමග සම්බන්ධවීමට උත්සහ කළා. එත් එය ජනතාව අතර ප්‍රසිද්ධ වූ නිෂ්ඵල උත්සහයක් වුණා. නමුත් මම දිගටම ඇපල් සමාගමට ආදරය කළා. මට එක්වරම වෙනත් අදහසක් හිතුනා. ඇපල් සමාගමෙන් ඉවත් වීම තවත් ජීවිතයක ආරම්භය නේද යැයි සිතුණා. ඇපල් සමාගමෙන් ඉවත්වීම තරම්මට තවත් අවස්ථාවක් තිබේද යන්න පිළිබදව මම සිතුවා. මේ අතර තමයි මට නෙක්ස්ට් (Next) සමාගම පිළිබඳ අදහස් සිතට ආවේ. අති සාර්ථක වීමේ බරපතල කම හා අලුතින් දෙයක් ආරම්භ කිරීමේදී මනස තුළ ඇති වන සැහැල්ලුවේ වෙනස මට දැනෙන්න ගත්තා. ඒ සැහැල්ලුව තුළ මගේ නිර්මාණාත්මක චින්තනය දියුණු කළා. එයත් මගේ ජීවිතයේ ස්වර්ණමය කාලයක්. Next සමාගමට අමතරව පික්සාර් (Pixar)සමාගම බිහිකිරීම ගැනත් මම සිතන්නට වුණා. ලෝකයේ පළමු පරිගණක ගත

සජීවිකරණ චිත්‍රපට නිර්මාණය වුණේ මගෙ පික්සාර් චිත්‍රාගාරය තුළ. එය ලෝකයේ වඩාත් සාර්ථකම සජීවිකරණ චිත්‍රාගාරයයි. මේ කාලයේදි තමයි මම වඩාත් ආදරේ කරන මගේ බිරිඳ ලොරින් සමග ප්‍රේමයෙන් වෙලෙන්නට පටන් ගත්තේ. මේ සියල්ල සමග නැවත මම සුන්දර ජීවිතයකට පිවිසුණා. නැවත, කවුරුත් නොසිතූ පරිවර්තනයක් ව්‍යාපාර ලෝකය තුළ සිදුවුණා. ඒ තමයි පික්සාර් ආයතනය ඇපල් සමාගම විසින් මිලදි ගනු ලැබීම. මේ ගනුදෙනුව අතරේ මම නැවත ඇපල් සමාගමට එකතු වුණා. මා නිර්මාණය කළ, මාගේ නිවසේ ගරාජයෙන් මගේ දහඩිය කදුලින් ගොඩනැගුණු මගේ ලෝකයට නැවත පිවිසීම කෙතරම් ආශ්චර්ය ජනක ද? මේ අතර මගෙත් මගේ පෙම්වතිය ලොරින්ගේත් විවාහය සිදුවුණා. අද ඇපල් සමාගමේ වඩාත් ප්‍රභල වර්ධනය පසුපස සිටින්නේ මා අතින්ම බිහි කළ නෙක්ස්ට් සමාගම විසින් නිපදවනු ලබන තාක්ෂණයයි.

මා ඇපල් සමාගමෙන් එළියට විසි නොවුනේ නම් මේ තරම් සාර්ථකත්වයක් මේ තරම් ජයග්‍රහණ රැසක් මට ලැබේවි යැයි මම කිසි විටෙකවත් සිතන්නේනෑ. අත්දැකමක් ලෙස සලකන විට මෙහි කිසිදු සුන්දරත්වයක් නෑ. මට මේ තුළ අත් දකින්නට සිදුවූ දේ හරියට තිත්ත බෙහෙත් ගන්නවා වගෙයි. එහෙත් අපට සුව වීමට නම් මේ කටුක යථාර්ථයට මුහුණ දෙන්න වෙනවා. ඒ වගේම තමයි ව්‍යාපාර හෝ තම තමන්ගේ ක්ෂේත්‍ර ගත්තොත් එහි සමස්ථ සාර්ථකත්වය වෙනුවෙන් අපට තිත්ත අත්දැකම් වලට මුහුණ දීමට සිදුවෙනවා.

එය අප කවුරුත් වටහා ගත යුතුයි. මගේ ජීවිතය ඇසුරින් මම ඔබට කියන්නේ කිසිදිනෙක තමන් අලුම්කරන දෙයින් මිදෙන්නට එපා. ඒ තුළ ජීවත් වෙන්න. එහි තිබෙන මිහිරි කටුක බව අත් දකින්න. අවසානයේ ඔබට ඔබ විශ්වාස කරන, ඇලුම් කරන, ඔබ කැප කිරීම් කරන, ක්ෂේත්‍රය ජය ගත හැකි බව අත් දැකිය හැකි වනු ඇත.

සඳකැලුම් ජයතුංග,
ගණකාධිකාරි,
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්.

එරාජ්ගේ finance Joke



"ඌ...ඌ... නංගි පොඩ්ඩක් නවතිනවද"

"ඇයි අයියා"

"මී.... ම.ළ.. බයාට ආදරෙයි"

"මට අයියගේ අයි.ඩී. නම්බර් එක දෙනවද..මම බලලා උත්තරයක් කියන්නම්"

අයි.ඩී. නම්බර් එක...ඒ..මොකටද නංගි

අයියගේ ක්‍රිඩිට් රිපෝර්ට් එක බලලා උත්තරයක් කියන්නම්

සැතපුම් දස දහසක් දිගු මගක ආරම්භය, තබන එක පියවරකි.

HNB GRAMEEN
මෙහෙවර 15
2017 ජනවාරි - පෙබරවාරි

CRIB සභාපති කුසලානය බැංකු නොවන අනුකූලතා නිළධාරීන්ට

ණය තොරතුරු කාර්යාංශය මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන සය සාමාජික ක්‍රිකට් තරගාවලියට සමගාමීව ප්‍රථම වරට පවත්වනු ලැබූ බැංකු අනුකූලතා නිළධාරීන්ගේ සහ බැංකු නොවන අනුකූලතා නිළධාරීන්ගේ විශේෂ සය සාමාජික ක්‍රිකට් තරගයෙහි ජය බැංකු නොවන අනුකූලතා නිළධාරීන්ගේ කණ්ඩායමට හිමි විය. මෙහිදී බැංකු නොවන අනුකූලතා නිළධාරීන්ගේ කණ්ඩායමේ නායකත්වය HNB ග්‍රාමීන් සමාගමේ උෂාන් හපුආරච්චි මහතා දැරූ අතර බැංකු අනුකූලතා නිළධාරීන්ගේ කණ්ඩායමට නායකත්වය සැපයූයේ කොමර්ෂල් බැංකුව නියෝජනය කළ ෆිලිසියන් පෙරේරා මහතාය.

දැනුම වඩන්නයි - තැඟි දිනන්නයි මෙහෙවර පැණසර ප්‍රහේලිකා අංක - 04

ජයග්‍රාහකයින් තිදෙනෙකුට සදීපා ප්‍රකාශකයෝ වෙතින් රුපියල් 3000 වටිනා පොත් කට්ටල තුනක්

1 ලි				■	4		6
2				3	■	■	
	■	■	■	5		8 වූ	
7			■		■		■
9			10	■	14		15
	■	■		■	■		
■	11 වේ			12	■		
■	■	13			■	16	

උපකාරක - හරහට

1. ලොව විශාලතම අවි කන්ණාඩි නිශ්පාදනායතනය වූ Ray-ban හි හිමිකරු මෙනමින් හැඳින්වේ.
2. HNB ග්‍රාමීන් මඟින් හඳුන්වාදී ඇති ඉතුරුම් මත පදනම්ව ලබාදෙන ණයකි.
4. අන්නාසි සඳහා ප්‍රසිද්ධියක් ඉසිලූ ප්‍රදේශයකි.
5. සෞරග්‍රහ මණ්ඩලයට අයත් ග්‍රහ ලෝකයකි.
7. සිංහල මාස ක්‍රමයට අනුව දුරුතු මාසයට පසුව එන මාසය.
9. රාජධානියක් ලෙස ප්‍රකටය.
11. ප්‍රසිද්ධියේ භාන්ඩ අළෙවි කිරීම මෙනමින් හැඳින්වේ.
13. දක්ෂයා යන අරුත ද්‍රේ.
14. තිබහ යන අරුත ඇති පදයකි.
16. වී ගොවිතැන් කරනු ලබන කන්න දෙකෙන් එකකි.

පහලට

1. අවුරුදු සමයේ ක්‍රීඩා සඳහා මේ ගස යොදා ගැනේ.
3. ශිව දෙවියන්ට නමකි.
6. තොල්පෙති යන අරුත දේ
8. සිංහල රාජාවලිය පිළිබඳව මහාවංශයේ මුල් වෙළුමෙන් පසුව ලියැවුණායැයි සැලකෙන කොටස් හැඳින්වෙන්නේ මේ නමිනි.
10. 1658 දී ලංකාව .....පාලනයට නතු විය.
12. මවගේ මව පියාට නැන්දම්මා නම් නැන්දම්මාගේ සැමියා මවගේ පුතාට.....
15. සමන් දෙවියන්ගේ අඩවිය මෙනමින් හැඳින්වේ.

නම : ..... සේවක අංකය : .....
ශාඛාව : ..... ප්‍රහේලිකාව පිරවුයේ වෙනත් අයෙකු නම් ඔහුගේ / නම : .....
ඥාති සම්බන්ධය : .....
දිනය : ..... අත්සන : .....

මෙහෙවර පැණසර ප්‍රහේලිකාවේ බහුතරයක් උපකාරකයන් සැකසෙනුයේ මෙවර මෙහෙවර පුවත්පතේ පළව ඇති ලිපි වල අඩංගු කරුණු ඇසුරිනි. එම ලිපි කියැවූ ඔබට මෙම ප්‍රහේලිකාව පිරවීම කිසිසේත්ම අසීරු නොවනු ඇත. HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට මෙම තරඟය සඳහා සහභාගී විය හැකි අතර නිවැරදිව ප්‍රහේලිකාව පුරවා එවන්නන් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගන්නා ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් තිදෙනෙකුට සදීපා පොත් ප්‍රකාශකයෝ වෙතින් අගනා පොත් පාර්සල් 3 ක් පිරිනමන අතර, ඔබගේ විසඳුම් ලබන මස 3 වන සතියට පෙර සංස්කාරක - මෙහෙවර පැණසර, HNB ග්‍රාමීන් අංක 168, නාවල පාර, නුගේගොඩ ලිපිනයට ලැබෙන්නට සලස්වන්න.

මෙහෙවර පැණසර ජයග්‍රාහකයෝ ඔක්තෝබර්- නොවැම්බර් කලාපය

HNB ග්‍රාමීන් මෙහෙවර පුවත් සඟරාවේ ඔක්තෝබර්- නොවැම්බර් කලාපයේ "පැණසර" ප්‍රහේලිකාව විසඳා එවා ජයග්‍රහණය කළ ජයග්‍රාහකයන්ගේ නම් පහත පළ වේ. සදීපා ප්‍රකාශකයන් විසින් පිරිනමනු ලබන රු. 3000 වටිනා පොත් කට්ටල නුදුරු දිනකදීම ඔබ වෙත ලැබෙනු ඇත. අපේ උණුසුම් සුබ පැතුම්...

එස්. නදීකා ශ්‍රියානි (6374)
පුත්තලම ශාඛාව

අමිත්ත දුල්ලෑව
(5035) මාතලේ

එම් .කේ. විජේරත්න
චින්තක විජේරත්න(5697)
බලන්ගොඩ

සදීපා
• පොත් ප්‍රකාශනය • ප්‍රින්ට් හවුස්
• පොත් හල • ප්‍රින්ටර්ස්

සම්මානලාභී බෞද්ධ, සාහිත්‍ය හා අධ්‍යාපන පොත් ප්‍රකාශකයෝ

Sole Agent in Sri Lanka
PELANGI
Penerbitan Sdn. Bhd.
Malaysia.

කුඩා ළමුන්ට මුල සිට සරලව ඉංග්‍රීසි ඉගෙනීම සඳහා මැලේසියාවෙන් ගෙන්වන Phonics පොත් පෙළ

සී/ස සදීපා ප්‍රකාශකයෝ
SADEEPA PUBLISHERS(PVT)LTD
1060, මරදාන පාර, බොරැල්ල

දුරකථන : 011-2686114, 2694289, 2678043
ෆැක්ස් : 011-2678044
Email : sadeepapub@gmail.com

සැකය ඇතිවන්නේ අවබෝධය දුබල තැනය.

ප්‍රියලාල් අරංගල මහතා "Executive Master of Science" පශ්චාත් උපාධිය ලබයි

මැලේසියාවේ ASIA E UNIVERSITY මගින් මෙහෙයවන ලද මූල්‍යකරණය පිළිබඳ Executive Master of Science in Finance පශ්චාත් උපාධි සහතික පත්‍ර පාඨමාලාව හදාරා ASIA E UNIVERSITY මගින් පිරිනමනු ලබන Executive Master of Science පශ්චාත් උපාධි සහතිකය ලබා ගැනීමට HNB ග්‍රාමීන් සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී ප්‍රියලාල් අරංගල මහතා සමත්විය. එම ජයග්‍රහනය පිළිබඳව මෙහෙවරට අදහස් දැක්වූ අරංගල මහතා....

" ආයතනයේ කාර්ය බහුලත්වය අතර අධ්‍යාපන කටයුතුවල නිරත වෙන්න කොහෙත්ම පුළුවන් කමක් තිබුණෙ නෑ.එහෙත් අප කළමනාකාර අධ්‍යක්ෂතුමන් වූ චමින්ද ප්‍රභාත් මහතාගේ යෝජනාවක ට අනුව Asia E university මගින් මෙහෙය වනු ලබන ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවට පෙනී සිටියා. මෙහි කාලය වසරක් වුණත් මගේ අව්වේකිත්වය නිසා එහි බොහෝ දේශන මට මඟ හැරුණා. අන්තිමේදී පාඨමාලාව සම්පූර්ණ කරන්නට වසර එකහමාරක පමණ කාලයක් ගතවුණා. මේ සඳහා මම කරපු සමීක්ෂණය සඳහා සහකාර සාමාන්‍යාධිකාරී රමේෂ් ෆොන්සේකා මහතා ලබාදුන් උපදේශනාත්මක මග පෙන්වීම මට ඉතා වැදගත් වුණා. ඒ වගේම මගේ පුතා යතිදු චමුපති අරංගල සහ බිරිඳ නයනා අරංගලගෙන් ලැබුණු දිරි ගැන්වීම සහ සහයෝගය විශේෂයෙන් සිහිපත් කළ යුතුයි. එසේම මෙම ජයග්‍රහනය ලබා ගන්නට මට මඟ පෙන්වූ අප කළමනාකාර අධ්‍යක්ෂක තුමන්ටත් සහයෝගය ලබාදුන් සැමටත් මගේ අවංක ආදර ස්තූතිය පිරිනමන්නට මෙය අවස්ථාවක් කර ගන්නවා.

HNB ග්‍රාමීන් ගනුදෙනුකරුවන් සඳහා ATM කාඩ්පත හඳුන්වාදෙයි

HNB ග්‍රාමීන් ෆයිනෑන්ස් ලිමිටඩ් මගින් සිය ශාඛාවන්හි ගනුදෙනුකරුවන් සඳහා HNB ග්‍රාමීන් ATM කාඩ්පත හඳුන්වාදීම සංකේතවත් කරමින් පළමු කාඩ්පත් නිකුතුව පසුගිය නොවැම්බර් මස 09 දින HNB ග්‍රාමීන් නගර ශාඛා පරිශ්‍රයේදී සිදුකරන ලදි. නගර ශාඛාවෙහි ගනුදෙනු කරුවන් සඳහා නිල වශයෙන් ATM කාඩ්පත් ලබාදීමේ අවස්ථාවට HNB ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්හි කළමනාකාර අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත්, අධ්‍යක්ෂිකා ක්‍රිෂාන්ති තම්බයියා ප්‍රධාන මෙහෙයුම් නිලධාරී ප්‍රියලාල් අරංගල, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් වන ඇනස්ලි ප්‍රනාන්දු, බිමල් සෙනෙවිරත්න, නගර ශාඛා කළමනාකරු සුරංග හේරත් යන මහත්ම මහත්මිහු සහභාගී වූහ.

සිය ගනුදෙනුකරුවන් සඳහා වඩාත් පහසුවෙන් සහ ඉක්මනින් ගනු දෙනු කටයුතු සිදු කරගැනීමටත් දිවයින පුරා පිහිටි HNB ටෙලර් යන්ත්‍ර හරහා අනවශ්‍ය රස්තියාදුවකින් තොරව ගනුදෙනු කටයුතු කරගැනීමේ පහසුවත් ඉදිරියේදී HNB ග්‍රාමීන් ගනුදෙනුකරුවන් වෙත ලැබීම විශේෂත්වයකි.

මෙහෙවර
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර
නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් : 0112825843
ඊ-මේල් :- manjula.p@hnbgrameen.lk
වෙබ් :- www.hnbgrameen.com

අධික්ෂණය :- චමින්ද ප්‍රභාත්
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- කණිෂ්ක විජේතුංග (අර්ජුන ග්‍රැෆික්ස්)
මුද්‍රණය :- අර්ජුන ග්‍රැෆික්ස්, රත්තනපිටිය.
ඡායාරූප ශිල්පී :- ඩිශාන් සමින්ද

ජනවාරි මාසයේ උපන්දිනය සමරන
එච් එන් බී ග්‍රාමීන් සමාගමේ සහෝදර සැවොක මහත්ම මහත්මීන් වෙත
අපගේ හෘදයාංගම සුභ පැතුම් මේ සමඟ පිරිනමමු !

නම	දිනය	ශාඛාව
අමිත් විරකෝන් මහතා	ජනවාරි 01	නුවර
ටී නඩේශ්වර මහතා	ජනවාරි 01	මඩකලපුව
දළිනි ජයවික්‍රම මෙනෙවිය	ජනවාරි 01	ප්‍රධාන කාර්යාලය
බුද්ධිකා ගුණවර්ධන මෙනෙවිය	ජනවාරි 01	ගලෙන් බිඳුණු වැව
කි. විශ්නේශ්වරන් මහතා	ජනවාරි 01	නුවර එළිය
උපුල් ප්‍රියශාන්ත මහතා	ජනවාරි 02	රත්නපුර
දමිත්ද ගුණරත්න මහතා	ජනවාරි 02	වැලිමඩ
එඩ්වඩ් සෘසේ මහතා	ජනවාරි 02	මත්තාරම
පෝල් සලිමී මහතා	ජනවාරි 02	මීගමුව
බුද්ධික මධුශාන් මහතා	ජනවාරි 02	නිකවැරටිය
ක්‍රියාන් මධුශංඛ මහතා	ජනවාරි 02	කැකිරාව
සමීන්ද රත්නායක මහතා	ජනවාරි 03	වැලිමඩ
උපුල් රෝහණ මහතා	ජනවාරි 03	ගම්පහ
සම්පත් රාජපක්ෂ මහතා	ජනවාරි 03	නිකවැරටිය
ලක්ෂිත පෙරේරා මහතා	ජනවාරි 03	ප්‍රධාන කාර්යාලය
කුමාර ඉංදික මහතා මහතා	ජනවාරි 03	බලංගොඩ
සතුන් චාමර මහතා	ජනවාරි 03	බණ්ඩාරගම
මධුශාන් ගමගේ මහතා	ජනවාරි 03	බදුල්ල
ලහිරු සඳමාල් මහතා	ජනවාරි 03	මැදවච්චිය
අනුෂ කුලසිරි මහතා	ජනවාරි 04	හොරණ
ටී වසන්තන් මහතා	ජනවාරි 04	ත්‍රිකුණාමලය
චින්තක බණ්ඩාර මහතා	ජනවාරි 04	කුරුණෑගල
බුද්ධික බණ්ඩාර මහතා	ජනවාරි 04	කුරුණෑගල
ඉසුරු සන්සර මහතා	ජනවාරි 04	මතුගම
කේ. ආරාමුගම් මහතා	ජනවාරි 04	මුලතිවු
විකුම් බිසර මහතා	ජනවාරි 04	මැදවච්චිය
අතුරුද්ධ බණ්ඩාර මහතා	ජනවාරි 04	නුවරඑළිය
ඉංදික බණ්ඩාර මහතා	ජනවාරි 05	පොළොන්නරුව
සුසත් බුද්ධික මහතා	ජනවාරි 05	හලාවත
දුලාජ් මධුශාන් මහතා	ජනවාරි 05	නගර ශාඛාව
කුමාර රාජපක්ෂ මහතා	ජනවාරි 05	පොළොන්නරුව
සංජය සිරිමාන්න මහතා	ජනවාරි 05	ගම්පහ
නුවන් ප්‍රියංකර මහතා	ජනවාරි 05	ටිකිල්ල ගස්කඩ
ධනුෂ්ක අස්මිමය මහතා	ජනවාරි 07	ප්‍රධාන කාර්යාලය
කේ පාර්තිපන් මහතා	ජනවාරි 07	ත්‍රිකුණාමලය
එරංග කුමාර මහතා	ජනවාරි 07	බදුල්ල
ප්‍රසාදිනි විරකෝන් මෙනෙවිය	ජනවාරි 07	ප්‍රධාන කාර්යාලය
රදීත් නිශාන්ත මහතා	ජනවාරි 07	පිටිගල
හර්ෂණ රංගල් මහතා	ජනවාරි 07	ගාල්ල
ශාන්ත සිල්වා මහතා	ජනවාරි 08	අම්බලන්ගොඩ
සුරංග නවරත්න මහතා	ජනවාරි 08	හලාවත
ප්‍රියශාන්ත දිසානායක මහතා	ජනවාරි 09	ප්‍රධාන කාර්යාලය
මධුශානි පෙරේරා මෙනෙවිය	ජනවාරි 09	නිට්ටඹුව
නිරෝෂාන් තංග මහතා	ජනවාරි 09	පදවිය
ඩී.එම්. විශ්මින් මහතා	ජනවාරි 09	පොළොන්නරුව
රෝහිත කුමාර මහතා	ජනවාරි 10	අනුරාධපුරය
පී කුසාලියන් මහතා	ජනවාරි 10	මුලතිව්
අනුරාධ චතුරංග මහතා	ජනවාරි 10	අවිස්සාවේල්ල
ප්‍රභාත් මධුවන්ත මහතා	ජනවාරි 11	ප්‍රධාන කාර්යාලය
සිසිර කුමාර මහතා	ජනවාරි 11	දඹුල්ල
නමිත් චාමර මහතා	ජනවාරි 11	ගම්පහ
මංජුල දිසානායක මහතා	ජනවාරි 12	නුවර එළිය
ප්‍රියන්ත මනෝජ් මහතා	ජනවාරි 12	නොවිය්‍යාගම
අමිල ප්‍රභාත් මහතා	ජනවාරි 13	ප්‍රධාන කාර්යාලය
කුමිද්ද බණ්ඩාරනායක මහතා	ජනවාරි 13	ප්‍රධාන කාර්යාලය
චමිල් ශ්‍රීපාල් මහතා	ජනවාරි 13	මාතලේ
එන් උරුසිර කුමාර මහතා	ජනවාරි 14	මඩකලපුව
ඉංදික සම්පත් මහතා	ජනවාරි 14	ගාල්ල
ධනුෂ්ක සම්පත් මහතා	ජනවාරි 14	මැදවච්චිය
අමල් නයනජිත් මහතා	ජනවාරි 14	ප්‍රධාන කාර්යාලය
නදීශ මධුවන්ත මහතා	ජනවාරි 14	බණ්ඩාරගම
ප්‍රියලාල් අරංගල මහතා	ජනවාරි 15	ප්‍රධාන කාර්යාලය
අසිත ඉන්දජිත් මහතා	ජනවාරි 15	තිස්සමහාරාමය
රනෙෂ් සුබසිංහ මහතා	ජනවාරි 15	වෙන්නප්පුව
කේ රවීෂන් මහතා	ජනවාරි 15	කන්තලේ
අමිල ශානක මහතා	ජනවාරි 15	හම්බන්තොට
ලහිරු අරඹවත්ත මහතා	ජනවාරි 15	පොළොන්නරුව
දුශාන්ත හේරත් මහතා	ජනවාරි 15	නුවර
ලක්මාල් කෝමරත්න මහතා	ජනවාරි 16	ප්‍රධාන කාර්යාලය
ඉෂාර සංගීත් මහතා	ජනවාරි 16	වැලිමඩ
එම් නන්තුජාන් මහතා	ජනවාරි 16	කිලිනොච්චි
ගයාන් සුමුදිත මහතා	ජනවාරි 16	හොරණ
අමිල හේරත් මහතා	ජනවාරි 17	ප්‍රධාන කාර්යාලය
සුජපයියා රවි මහතා	ජනවාරි 17	නාවලපිටිය
සුවේෂ් සුබසිංහ මහතා	ජනවාරි 17	බණ්ඩාරගම
දමින් පුෂ්ප කුමාර මහතා	ජනවාරි 17	බලංගොඩ
සුදත් විජේන්ද්‍ර මහතා	ජනවාරි 17	ප්‍රධාන කාර්යාලය
ඊ.දයානකුමාර් මහතා	ජනවාරි 17	මඩකලපුව
චන්දන පුෂ්පකුමාර මහතා	ජනවාරි 18	වැලිමඩ
තංග රත්නායක මහතා	ජනවාරි 18	මාතලේ
කේ තනුගන් මහතා	ජනවාරි 18	යාපනය

වේගයෙන් සතුට ලුහුබැඳ දුවන අය එය පසුකර යති.